
# දූතයා

ආත්මික සඟරාව
66 වන කාණ්ඩය
2021 පළමු වන කලාපය



සිංහල ලේ ද?
දෙමළ ලේ ද?
මුස්ලිම් ලේ ද?
බර්ගර් ලේ ද?
නොව
යේසුස් වහන්සේගේ ලේ නොවෙයි නම්
අපි ගිනි විලේ

ශ්‍රී ලංකා රෙපරමාදු සභාව මඟින් ප්‍රකාශිතයි.

# පටුන


01 OPTION — කතුවැකිය

02 OPTION — පොළොව මිනිසාට අයිති නැත මිනිසා පොළොවට අයිතිය

03 OPTION — බලාපොරොත්තුවේ පහන් හදවතෙහි දල්වන්න

04 OPTION — දෙවියන්වහන්සේගේ අපිරිමිත ගුණාංග

05 OPTION — හිත ඉල්ලන ආදරය

06 OPTION — තරුණ

07 OPTION — ළමා පිටුව

08 OPTION — සදාරක්ෂිත සොල්දාදුවා


04 OPTION — ක්‍රිස්තු චරිතය තුළ අපගේ චර්යාව

03 OPTION — ඇත්තටම මියගියේ කායින්ද? ආබෙල්ද?

02 OPTION — මාකඳුර-කළානගෙදර යට ගිය අතීතය

01 OPTION — සභා පුවත්





**පුත්තලම ගෘහ දේවස්ථානය සෑදීම**


<u>සංස්කාරක</u>
ගරු චමින්ද රත්නායක සභාපාලක තුමා

<u>පරිගණක යතුරු ලියනය</u>
රෝහිනී පෙරේරා
ඩබ්ලිව්. පී. විශ්ව ශක්ති

<u>කවරය සහ පිටු සැකසුම</u>
නීලානී අබේසේකර

<u>ප්‍රකාශනය</u>
ක්‍රිස්තියානි රෙපරමාදු සභාව
අංක 363, ගාලු පාර, කොළඹ 06.
දුරකථනය : 011 2 360 861


නොමිලයේ ඉගැන්වෙන තැපැල් මාර්ගික බයිබල් පාඨමාලාව සහ පොත්, සඟරා ලබා ගැනීමට විමසන්න:
**සුභ අස්න බයිබල් විද්‍යාලය, අංක 363, ගාලු පාර, කොළඹ 06.**

ඔබගේ නිර්මාණ (කවි, ලිපි, රචනා, සාක්ෂි) දූතයා සඟරාවේ පළ කිරීම පිණිස යොමුකරන්න:
**දූතයා කතෘ, අංක 363, ගාලු පාර, කොළඹ 06.**

# කතුවැකිය..

## ශාරීරිකව Positive ආත්මිකව Negative ද?

මේ දවස් වල අපට නිතර අසන්නට ලැබෙන වචන දෙකකි. එනම්, පොසිටිව්ද ? නෙගටිව්ද? යන්නයි. දිනක් අප දේවස්ථානයේ ඉරුදින යාච්ඤා කාලයට සහභාගී වූ රෝහල් සේවයේ නිරත දේව දාසයෙකුගේ යාච්ඤාව වූයේ, දැනට සිටින කොරෝනා පොසිටිව් රෝගීන් නෙගටිව් වන පිණිසත්, නෙගටිව් අය පොසිටිව් නොවන පිණිසත්ය. වර්තමාන ලෝකයා මුහුණ දී ඇති කොවිඩ් වසංගතය හමුවේ මෙම යාච්ඤාව කාලෝචිත යැදුමක් වන අතර කිතුණු අපගේ අපේක්ෂාවද එසේ විය යුතුය.

**'ගමේ එකෙක් පොසිටිව් වෙච්ච ගමන්, අනිත් උන්ගේ ගතිගුණ නෙගටිව් වෙනවා"** මුහුණු පොතේ (Facebook) පළ වූ අදහසකි. බොහෝ විට එය සත්‍ය විය හැක.

මෙම කොරෝනා වසංගතය ඉතාමත් වේගයෙන් පැතිරෙන අවස්ථාවක පොසිටිව් රෝගීන් ඔබගේ පවුලේ ඥාතීන් අතරද, හිත මිතුරන් අතරද, දේවස්ථානයේ ඇදහිලිවතුන් අතරද හා ඔබගේ අසල්වැසියන් අතරද සිටිය හැක. ඔබ හොඳින් දැන හඳුනන්නාවූ ඔවුන් පිළිබඳව ඔබගේ ආකල්ප හා හැඟීම් නෙගටිව් විය හැක.

මන්ද යත් ඔබ කිතුණුවකු ලෙස ඔවුන් පිළිබඳව නෙගටිව් අයුරින් සිතන්නෙක් නම්, ඔවුන් උදෙසා ඔබට සේවයක් නොමැති වනු ඇත. එදා යේසුස්වහන්සේ සාමාන්‍ය ජනතාව ළං වන්නට භය වූ, අකමැති වූ රෝගීන්ට සේවය කළ අන්දම අපට යමක් සිහිපත් කරනු ඇත.

ඒ නිසා දේව දරුවන් වන අප හට දෙවිඳුන්ගේ ප්‍රේමය, දයාව සහ කරුණාව එවැන්නන් කෙරෙහි දක්වන්නට අනර්ඝ අවස්ථාවක් උදා වී ඇත. එනම්, දුරකථනයකින් අමතා ඔහුගේ හෝ ඇයගේ දුක සැප විමසා බැලීම, දුරකථනයෙන් ඔවුන් හා සමග යාච්ඤා කිරීම, අත්‍යාවශ්‍ය භාණ්ඩ ලබා ගැනීමට උපකාර කිරීම. (ගේට්ටුවෙහි හෝ ඒ ආසන්නයෙන් තැබීම) මන්ද ඉන් ඔබත් ආරක්ෂා වෙමින් ඔවුන්වද ආරක්ෂා කිරීම දේව කැමැත්ත වන හෙයිනි.

එලෙසම බැරි වෙලා හෝ ඔබ ශාරීරිකව පොසිටිව් වුවහොත් ආත්මිකව නෙගටිව් වන කිතුණුවෙක්ද? එනම්, ඔබ ඊට වැඩුණු කිතුණුවකු ලෙස මුහුණ දෙනවා වෙනුවට දෙවියන්වහන්සේ කොහිද? උන්වහන්සේ සිටිනවානම් මෙලෙස වනවාද? මෙය වැළඳීමෙන් මා වළක්වන්නට නොහැකි වුයේ මන්ද? යනුවෙන් අසයිද ?
නැතහොත් ඔබගේ ආත්මික ජීවිතය, ඇදහිල්ල, යාච්ඤාව සහ දෙවියන්වහන්සේ අතර ඇති සබඳතාවය නෙගටිව් වේද?

එසේනම් ඔබත් ඔබගේ ආත්මික ජීවිතය වැලි මත තම නිවස ගොඩනගා ගන්නා ලද පුද්ගලයා හා සමාන වේ.

එනම් **'වැසි වැස, ජලය ගලා, හුළග හමා, ඒ ගෙට ගැසුවේය" ඒක වැටුණේය. එහි වැටීමද බලවත් විය."** (මතෙව් 7 : 27)

නමුත් දෙවියන්වහන්සේ සොයන්නේ සහ සේවයට කැඳවන්නේ මෙබඳු කිතුණුවන් නොවන්නේය. එනම් ඔබ ශාරීරිකව පොසිටිව් වුවත්, ආත්මිකව නෙගටිව් නොවී සිටිය යුතුය. මක්නිසාද දෙවිඳුන් කෙරෙහි වන අපගේ ඇදහිල්ල,

දාවිත් මෙන් **'මරණ සෙවණේ මිටියාවත මැදින් යන්නෙමි නමුත්, කිසි උපද්‍රවයකට භය නොවන්නෙමි" මක්නිසාද ඔබ මා සමගය."** ( ගීතාවලිය 23 : 4)

හබක්කුක් අනාගතවක්තෘ තුමා මෙන්, **'විපත්ති දවසේදී මට නිශ්චලය ලැබේ. මක්නිසාද අත්තික්කා ගස දළු නොලෑවත්, මුද්‍රිකවැල්වල ඵලදාවක් නොතිබුණත්, ඔලිව ගසේ ඵල හට නොගත්තත්, කෙත්වලින් භෝජන නොලැබුණත්, ගාලෙන් එළු බැටළු රැළ සිඳ දමනු ලැබුවත්, පට්ටි වල ගවයන් නැතුව ගියත් මම වනාහී ස්වාමීන්වහන්සේ කෙරෙහි සන්තෝෂවන්නෙමි."** (හබක්කුක් 3 : 17 - 18) එනම් ඔහු පවසන්නේ තමා සන්තක සියල්ල විනාශ වුවද තම ඇදහිල්ල විනාශ නොවන බව හා සියල්ල කඩා වැටුණද ඇදහිල්ල කඩා නොවැටෙන බවය.

ෂද්‍රක්, මේෂක්, අබෙද්-නෙගෝ මෙන් **'මේ ගැන ඔබට කිසි උත්තරයක් දෙන්ට අපට ඕනෑ නැත. ඇවිළෙන ගිනි උදුනෙන් ගළවන්ට නම් අප සේවය කරන අපේ දෙවියන් වහන්සේට පුළුවන" රජ්ජුරුවෙනී, උන්වහන්සේ ඔබගේ අතින් අප ගළවන සේක. එසේ නොකළත්, රජ්ජුරුවෙනී, ඔබගේ දෙවිවරුන්ට අප සේවයකරන්නේවත් ඔබ පිහිටුවා තිබෙන රන් රූපයට නමස්කාර කරන්නේවත් නැති බව ඔබ දැනගත මැනව"**
(දානියෙල් 3 :16-18). මොවුන්ගේ විශ්වාසය වුයේ අප ජීවත් වුවත්, මිය ගියත් දෙවියන් වහන්සේ කෙරෙහි වන අපගේ විශ්වාසය මිය නොයන බවය.

**එබැවින් මෙම වසංගතය හමුවේ එවන් ඇදහිල්ලක් ඔබටත් මටත් තිබේද ? නොසිතූ මොහොතක ඔබ පොසිටිව් වුවහොත් ඔබගේ ඇදහිල්ල නෙගටිව් නොවන ලෙසද,
ශාරීරිකව පොසිටිව් වුවත් ආත්මිකව ද
පොසිටිව් වන්න මාගේ යැදුම වේ.**

සියළු ගෞරවයද, මහිමයද හා ප්‍රශංසාවද
දෙවිඳුන්ටම වේවා

**ගරු චමින්ද රත්නායක සභාපාලක තුමා**



# පොළොව මිනිසාට අයිති නැත මිනිසා පොළොවට අයිතිය



**"අහසත් පොළොවත් පහවන්නේ ය. එහෙත් මාගේ වචනය කිසිවිටක පහ නොවන්නේ ය"** යැයි උන්වහන්සේ දෙසූ සේක. අද ලෝකයේ බොහෝ සෙනඟ අවිනිශ්චිත භාවයෙන්, භයෙන් හා වේදනාවෙන් පසුවන තත්වයකට පත්වෙලා සිටින බව අප කාහටත් දකින්නට හැකි දෙයකි. මුළු ලෝකයම වෙලාගෙන යන භීෂණයක් නිසා මනුෂ්‍යයන්ගේ බලාපොරොත්තුවේ ගමන නැවතුණු ආකාරයක් පෙනෙන්නට ඇත. අධි වේගයෙන් වටපිට නොබලා දුවන ගමනේ බලාපොරොත්තු නොවුන දේවලට මුහුණ දීමට වී ඇති විට, මේ සෑම දෙයටම එකිනෙකාට ඇඟිල්ල දික්කිරීමට අප පුරුදු වී ඇත. එතනින් නොනවතින අප, දෙවියන්වහන්සේ වෙතටද ඇඟිල්ල දික්කිරීමට පෙළඹෙන තැනට පත්වී ඇති බවක් පෙනෙනවා. දෙවියන්වහන්සේ කියන සංකල්පය පවා මිනිසුන් අද අභියෝගයට ලක් කරමින් සිටින්නේ. දෙවියන්වහන්සේ මේ විශ්වයම නිර්මාණය කරලා තියෙන්නේ කිසිම අඩුපාඩුවක් නොමැතිව සමතුලිත තාවයෙනුයි. එම සමතුලිතතාවය විනාශකරන්නේ අපමයි.

ඇළ. දොළ, ගංගා පිරිසිදුව මවා තියෙනවා. ගහ කොළ, සතා සිව්පාවා, කිසිම අඩුපාඩුවක් නොමැතිව මවා තියෙනවා. ස්වභාවිකව පවතින කිසිම දෙයකින් මේ ලෝකය විනාශ වෙන්නට  හේතු වන්නේ නැති බව ස්ථිරයි. ලෝකය විනාශ වෙන්නේ මනුෂ්‍යයා වන අප නිසයි. මනුෂ්‍යයාගේ පහසුවට සාදාගන්නා නිෂ්පාදනවල අතුරු ප්‍රතිඵල ලෝකයත් මුළු ජීවයත් විනාශ කරනවා. ඒ නිසා වෙන්නාවූ සෑම විනාශයක-ටම අඩු වැඩියෙන් ඔබත් මමත් වගකිව යුතුයි. කොරෝනා වෛරසය පැමිණීමත් සමගින් මුළු ලෝකයාම නව මාවතකට පිවිස ඇති බව දක්නට ඇත.

අපට දකින්නට ඇති ආකාරයේ විනාශයක් ලෙස පෙණුන ද අපට අලුතෙන් සිතීමට ප්‍රවේශයක් වී ඇති බව නම් දකින්නට හැකියි. දෙවියන්වහන්සේ විසින් මවන ලද මෙම පූජනීය පොළොව පමණක් නොව විශ්වයේ ඇතැම් ප්‍රදේශ පවා විනාශකිරීමේ ප්‍රයත්නයක අප සිටිනවා. මෙපමණ අලංකාරව මැවී ඇති ස්වභාවයන් විකෘති කිරීමෙන් තමන් රිසි ආකාරයට සාදාගැනීමට ගොස් එහි සමතුලිත තාවය විනාශ කරන ආකාරය රහසක් නොවේ. ඇතැමුන්ගේ ලොකුම විහිළුවට මාතෘකාව වී ඇත්තේ දෙවියන්වහන්සේ කියන සංකල්පයයි. භෞතිකව සිතන සෑම කෙනෙකු අතින්ම මේ මහපොළොව විනාශ වී ඇත.

මීට වසර ගණනකට ඉහතින් සිටි ඇමෙරිකානු රතු ඉන්දියානු නායක මහා සියටැල් තුමා දුටු ලෝකයේ වටිනාකම අද තාක්ෂණිකයින් පවා දැක නැති බව නම් සත්‍යයක්. එතුමා පවසන ආකාරයට මෙම පොළොවේ වටිනාකම මනාවට පසක් වේ. තරඟකාරී ලෝකයක එකිනෙකා පරයා යන්නට උත්සාහ කරන තුරු දෙවියන්වහන්සේ හෝ දෙවියන්වහන්සේගේ මැවීම තේරුම් ගන්නට නොහැකි වී ඇත. ශබ්ද දූෂණ, වායු දූෂණ, ජල දූෂණ තුලින් අනෙකුත් ජීවින් හට අප කරන්නේ විශාල අසාධාරණයක්. ඒ ජීවීන්ගේ පැවැත්මට තර්ජනයක්.

දෙවියන්වහන්සේ සියලු සත්වයින්ගෙන් මනුෂ්‍ය සත්වයා දෙවියන්වහන්සේගේ ස්වභාවයෙන් වෙන් කරන ලද මිනිසා තව දුරටත් පොළොවේ තවත් එක් සත්වයෙකු නොවීය. උත්පත්ති පොතේ 1:28 පදයෙහි සඳහන් ආකාරයට පොළොවේ ආධිපත්‍ය යන වචනය වැරදි ආකාරයට භාවිතා කිරීමට අද මනුෂ්‍යයා පෙළඹී ඇති බවයි පෙනෙන්නට ඇත්තේ. දේව මගපෙන්වීමෙන් පොළොවේ පූර්ණ වගකීම ගතයුතු බවට අදහස් කිරීමක් එම පදය තුලින් උන්වහන්සේ පෙන්වා දෙන සේක. ඒ මිසක් අපට කැමති කැමති ආකාරයට පොළොව විකෘති කිරීමටත්, අනෙක් ජීවීන් විනාශ කරන ක්‍රියාවන් කිරීමට අවසරයක් නැති බවත් දැකිය හැකියි. **ආධිපත්‍යය යනු මැවීම සූරා කෑමක් නොවන බව තේරුම් ගත යුතුයි. මේ ලෝකය උන්වහන්සේ මවා ඇත්තේ සියලුම ජීවින් උදෙසා මිසක් අපට පමණක් නොවේ.** බාබෙල් කොත ගොඩනැගීමේ හිතුවක්කාර පරිශ්‍රමයේදී උන්වහන්සේ අභිබවා යාමටත් උන්වහන්සේගේ පරමභාවය සුළු කිරීමටත් අහංකාරවූ මිනිසාගේ කතාව අදටත් එයාකාරයෙන්ම වලංගු වේ. එදා භාෂාව අවුල් කරමින් උන්වහන්සේ මිනිසාගේ හිතුවක්කාරකමේදී උත්තරවාදී වූයේ යම් සේද, අදත් හෙටත් උන්වහන්සේ යා යුතු මාර්ගයෙන් පිට පනින විට නියමාකාර මාර්ගය පෙන්වීමට පසුබට නොවන සේක.

පසුගිය කාලය තුළ ලෝකයේ ගමන මන්දගාමී වූ කාලය තුළ විනාශයට භාජනය වෙමින් පැවතුන ඕසෝන් ස්ථරය යථා තත්ත්වයට පත්වීමට පටන්ගත් බව දකින්නට හැකි විය. උන්-වහන්සේ අපගේ එඬේරා ය. ඔහු අත ඇත්තේ සැරයටිය හා කෝටුව ය. සැරයටියේ උඩ කෙලවරේ ඇති නැම්මෙන් වැරදි මග යන බැටළු පැටවන් නිසි මග තබන අතර, වැරදි මග හෝ ප්‍රමාදයක දී කෝටුවෙන් පහර දෙනු ඇති බව **"ඔබගේ දණ්ඩෙන් හා සැරයටියෙන් මට සැනසිල්ල ලැබේ"** යනුවෙන්

දාවිත් රජතුමා ගීතාවලියේ දී සඳහන් කර ඇත්තේය. පොළොව මිනිසාට අයිති නැත. මිනිසා පොළොවට අයිතිය යන සත්‍යය තේරුම් ගැනීමට අප අපොහොසත් වී ඇත. මැවීම කේන්ද්‍ර කරගත් අධ්‍යාත්මිකත්වය සඳහා වන අරගලයකින් යථාර්ථවාදී නොවූ විද්‍යාත්මක අදහසක් වීම සුදුසු නොවේ. මිනිසාගේ නායකයා මිනිසා යන සංකල්පය තමන් තුළ ඇති තාක්කල් අපගේ ආත්මාර්ථකාමිත්වයෙන් පරාර්ථකාමිත්වයට අවංක භාවයෙන් යුතු මාරුවක් අවශ්‍ය වන්නේය. ඒ මාරුව ආරම්භ කළ යුත්තේ කිතුණුවන් වන අපෙන්මයි. අප වැරදිකරුවන් ලෙස වැඩි කාලයක් සැප සම්පතින් ජීවත් වෙන්නට බලනවා මිසක් ඒ කාලය තුළ යහපත්ව ජීවත් වීමට උත්සාහ කරන බවක් පේන්නට නැත. කිතුණුවන් වශයෙන් අපගෙන් දෙවියන්වහන්සේ බලාපොරොත්තු වන්නේ කෙටි හෝ දිගු ජීවිත කාලයකදී උන්වහන්සේගේ බලාපොරොත්තු ඉටු කිරීමයි. කිතුණුවන් වශයෙන් ඔබටත් මටත් මේ ලෝකයේ සියල්ලන්ටත් වෙන්නාවූ ව්‍යසනයන් අවම කිරීමට දායක විය හැකියි. **මනුෂ්‍යයාගේ විනාශකාරී හැසිරීම නිසා මනුෂ්‍යයාම විනාශ වන බව කිතුණුවන් වන ඔබත් මමත් නොදන්නා දෙයක් නොවේ.** බයිබලය පුරාවටම අනාගතවක්තෘවරුන් තුලින් වරින් වර දෙවියන්වහන්සේ පණිවිඩ එවා ඇති බව දකින්නට හැකියි.

ආමොස් 5 : 16
"එබැවින් ස්වාමිවූ සේනාවල දෙවිවූ ස්වාමීන්වහන්සේ මෙසේ කියන සේක: සියලු පළල් මාවත්වල වැලපීම වන්නේය: සියලු වීථිවල ඔව්හු-අනේ, අනේයයි කියන්නෝය: වැලපෙන පිණිස ගොවියාටත් විලාප කියන පිණිස ළතෝනි කීමෙහි දක්ෂ අයටත් අඬගසන්නෝය"

අද මේවා අපට ඇසීමට දැකීමට ඇත. අප අපේ හිතුවක්කාරකම් වලින් පිරිණු ජීවිතවල වටිනාකම තේරුම් ගැනීමට නොහැකි වී ඇති බවක් පෙනේ. ස්වභාව ධර්මයේ වස්තූන්ට භය වෙමින් නමස්කාර කරන මිනිසා සියල්ල ස්වභාව ධර්මය මත පටවයි. එහෙත් එය මැවූ තැනන්වහන්සේ පිළිගැනීමට තරම් නිහතමානී නොවන්නේ තමුන් තුළ ඇති උද්දච්චකම නිසාය. තව වසර 10 කින් අංශක 4 කින් ලෝක උෂ්ණත්වය ඉහල යන බව සඳහන් කරන විද්‍යාඥයින් අපට අඟවන්නේ අනතුරක් බව පැහැදිලියි. එම අසමතුලිතතාවය දෙවියන්වහන්සේගේ අඬුවක් වන්නේද ? ආමෝස් පොතේ 8:11,12 කියන ආකාරයට
**"බලව, හානියක්, එනම් කෑම හානියක්වත් වතුර පිපාසයක්වත් නොව ස්වාමීන්වහන්සේගේ වචන ඇසීමේ හානියක්, මා විසින් දේශයට එවන දවස් පැමිණෙන්නේය. එවිට මනුෂ්‍යයෝ ස්වාමීන්වහන්සේගේ වචනය සොයන පිණිස මුහුදෙන් මුහුදට ගමන් කරන්නෝය, උතුරේ සිට නැගෙනහිරටද ඔබ මොබ දුවනවා ඇත. නුමුත් ඔවුන්ට සම්බවෙන්නේ නැත."**


අප උත්සාහ කරන්නේ අපේ ජීවත්වෙන කාලය වැඩිකර ගැනීමටත් ඒ කාලය සැප සම්පත් භුක්ති විඳිමින් ජීවත් වීමටත්ය. නුමුත් දෙවියන්වහන්සේගේ ස්වරූපයෙන් මවා ඇති අපේ අභ්‍යන්තර මනුෂ්‍යයා ජීවත් කිරීමටත්, පිරිසිඳුව තබා ගැනීමටත් අප කොපමණ උනන්දු වෙනවාද යයි අප තේරුම් ගත යුතුයි. දෙවියන්වහන්සේ අපෙන් බලාපොරොත්තු වන දේ අප තේරුම් ගත යුතුයි.

යෝවෙල් 2:12,13
**"එහෙත් දැන්වත් නුඹලාගේ මුළු සිතින්ද නිරාහාරව සිටීමෙන්ද ඇඬීමෙන්ද වැලපීමෙන්ද මා වෙතට හැරී එන්නැයි ස්වාමීන්වහන්සේ කියන සේක. එසේය, නුඹලාගේ වස්ත්‍ර නොව නුඹලාගේ සිත් ඉරාගන, නුඹලාගේ දෙවිවූ ස්වාමීන්වහන්සේ වෙතට හැරෙන්න. මක්නිසාද උන්වහන්සේ දයාවන්තවූ, අනුකම්පාවෙන් පූර්ණවූ, ඉවසිලිවන්තවූ, ඉතා කරුණාවන්තවූ කෙනෙක්ය: උන්වහන්සේ විපත්තිය ගැන තැවෙන සේක."**

අපේ වෙනස් වීම උන්වහන්සේ අපේක්ෂා කරනු ඇත. දෙවියන්වහන්සේගේ හඬ හඳුනාගත යුතුයි. මන්ද මේ මුළු විශ්වයටත් වඩා උන්වහන්සේගේ වචනය සදාකාලික බව පෙන්වා දී ඇති නිසාය.

මාර්ක් 13:31-37
**"අහසත් පොළොවත් පහවන්නේය. නුමුත් මාගේ වචන පහනොවන්නේය. නුමුත් ඒ දවසවත් ඒ පැයවත් පියාණන්වහන්සේ මිස අන් කිසිවෙක් දන්නේ නැත, ස්වර්ගයෙහි සිටින දූතයෝවත් පුත්‍රයාවත් නොදනිති. ඒ කාලය කවදා වේදැයි නුඹලා නොදන්න බැවින් ප්‍රවේසම් වී, අවදිව ඉඳ යාච්ඤා කරන්න. ඒ වනාහි තමාගේ දාසයන්ට බලයද එකිනෙකාට තම තමාගේ වැඩද දී, අවදිව සිටින්නැයි දොරටුපාලයාට අණ දී, තමාගේ ගෙදරින් පිටත්ව ගොස් අන් රටක නැවතී සිටින මනුෂ්‍යයෙකුට සමානය. එබැවින් ගෙදර ස්වාමියා හදිසියෙන් ඇවිත් නුඹලා නිදා ඉන්නවා නොදක්නා පිණිස අවදිව සිටින්න. මක්නිසාද ඔහු එන්නේ කොයි වේලේද එනම් සවසද මධ්‍යම රාත්‍රියේ ද කුකුළා හඬලන වේලේද අලුයමදැයි නුඹලා නොදන්නහුය. මම නුඹලාට කියන දේ සියල්ලන්ටම කියමි-අවදිව සිටින්නැයි කීසේක."**

ගරු මේජර් අනුර විතාන දේවගැති තුමා
ගැළවීමේ හමුදාව
යුදහඬ හා පවන සඟරා වල
හිටපු කර්තෘ



# දෙවියන්වහන්සේගේ අපිරිමිත ගුණාංග

## 1. ස්වාධිපත්‍යය. –The Sovereignty

උන්වහන්සේ අදෘශ්‍යමාන දෙවියන්වහන්සේගේ ස්වරූපයය, මුළු මැවිල්ලේ කුළුඳුලාණෝය. **මක්නිසාද සිංහාසන වේවා, ස්වාමිකම් වේවා, අධිපතිකම් වේවා, බලපරාක්‍රම වේවා, ස්වර්ගවල සහ පොළොවෙහිත් ඇති පෙනෙන්නාවූ දේවල්ද නොපෙනෙන්නාවූ දේවල්ද යන සියල්ල උන්වහන්සේ තුළ මවන ලද්දේය. සියලු දේ උන්වහන්සේ කරණකොටගෙනද උන්වහන්සේ උදෙසාද මවා තිබේ. උන්වහන්සේ සියල්ලටම පළමුවෙන් සිටින සේක, සියල්ලද උන්වහන්සේ තුළ පවතින්නේය.** ( කොලස්සි 1:15-17)
ක්‍රිස්තු භක්තික දේවවාදය තුළ දෙවියන්වහන්සේගේ වැඩසිටීම පැහැදිලි ලෙස විග්‍රහ කරයි. උන්වහන්සේ ස්වාධීනව, ස්වයංව, සදාකාලිකව වැඩසිටින සේක. දෙවියන්වහන්සේව තේරුම් ගැනීමට නම්, උන්වහන්සේගේ ගුණාංග අප විසින් තේරුම් ගත යුතු වේ. සර්වබලධාරී, සර්වවාසී, හා සර්වඥාන ගුණාංග වලින් උන්වහන්සේ පරිපූර්ණව සිටින සේක.

## 2. ඔම්නිපොටෙන්ස්- Omnipotence

උන්වහන්සේගේ සර්වබලධාරීත්වය ගැන අද අප අධ්‍යනය කරමු. මෙම ගුණාංගයට දෙවියන්වහන්සේගේ බලය හා එහි සියළු අධිකාරිත්වයද ඇතුලත්ය. දෙවියන්වහන්සේට තම ශුද්ධවූ කැමැත්තට අනුකූලව සියල්ල ඉටු කිරීමටද, එවා දරා ගැනීමට හා සියල්ල තම අභිමතය පරිදි පාලනය කිරීමටද හැකියාව පවතින සේක. Omnipotence යන ඉංග්‍රීසි වචනයෙන් උන්වහන්සේගේ සර්වාධිපත්‍යය හා බලය විස්තර කරයි. ලතින් භාෂාවෙන් "ඔම්නි" යන්නෙහි අර්ථය "සියළු" වන අතර "පොටෙන්ස්" යන්නෙහි අර්ථය "ආධිපත්‍යය" යන්නයි.
උන්වහන්සේගේ බලයට සීමාවක් නොමැති අතර, තම අභිමතය පරිදි සියල්ල ඉටු කිරීමට හැකියාවද උන්වහන්සේ තුළ පවතින සේක.


**"ස්වාමීන්වහන්සේට බැරි දෙයක් ඇද්ද?"** (උප්පත්ති 18:14),
**"මම සකල මිනිසුන්ගේ දෙවියන්වහන්සේ වන සමිඳාණන්වහන්සේ ය. මට කිරීමට දුෂ්කර කිසි දෙයක් ඇද්ද?"** (යෙරමියා 32:27)
ලෙස මේ අයුරින් ශුද්ධ ලියවිල්ල උන්වහන්සේගේ අසීමිත බලය ගැන විස්තර කර තිබේ.

"මහෝත්තම දෙවි ස්වාමීනි, ඔබේ මහත් බලයෙන් ද පරාක්‍රමයෙන් ද ඔබ අහසත් පොළොවත් මැවූ සේක. ඔබට බැරි කිසි දෙය ක් නැත්තේ ය" යයි පරණ ගිවිසුම සාක්ෂි දරයි.
යේසුස්වහන්සේ විසින් තම ශ්‍රාවකයන් දෙස බලා "මිනිසුන්ට නම් එසේ කළ නොහැකිය. එහෙත් දෙවියන්වහන්සේට සියල්ල කළ හැකිමය" යි වදාළ සේක. (මතෙව් 19:26)

දෙවියන්වහන්සේගේ අනන්තවූ, අපිරිමිතවූ මෙම බලය අවබෝධ කරගැනීම සඳහා ශුද්ධ බයිබලය වඩාත් උනන්දු ලෙස අධ්‍යයනය කළ යුතුය. **"අප තුළ ක්‍රියා කරන බලය කරණකොටගෙන අප ඉල්ලන, සිතන සියලු දේට වඩා අධික ලෙස කරන්නට බලය ඇති දෙවියන්වහන්සේ"** (එපිස 3:20) ලෙස උන්වහන්සේ අපිරිමිත හා අනන්ත වූ බලය ඇති තැනන්වහන්සේ බව පාවුල් තුමා තම අත්දැකීමෙන් විස්තර කරයි.


## 3. නමුත් ඇතැම් ක්‍රියා උන්වහන්සේට කල නොහැක.

දෙවියන්වහන්සේ අති ශුද්ධවූ තැනන්වහන්සේය. උන්වහන්සේගේ චරිත ගුණාංග අධ්‍යයනයෙන් පැහැදිලි වන කරුණු කාරණා අනුව ඇතැම් ක්‍රියා උන්වහන්සේ නොකරන සේක. උන්වහන්සේ තම චරිතයට සමගාමීව වැඩ සිටීම ප්‍රතික්ෂේප නොකරන සේක. උන්වහන්සේගේ සර්ව බලයට අනුව තමන්වහන්සේගේ ශුද්ධවූ කැමැත්ත මත විශ්වයේ සියල්ල උන්වහන්සේ විසින් ක්‍රියාවට නගන බව නිර්වචනය කෙරේ. **"බොරු නොකියන දෙවියන්වහන්සේ පූර්ව කාලවලට ප්‍රථමයෙන් පොරොන්දු වුණාවූ"** (තීතස් 1:1) යන ශුද්ධ ලියවිලි කාණ්ඩයෙන් උන්වහන්සේ බොරු නොකියන තැනන්වහන්සේ බවට පෙන්වා දෙයි. **"දෙවියන්වහන්සේ නපුරෙන් පරීක්ෂා කරනු ලබන්ට නුපුළුවන"** ( යාකොබ් 1:13) යයි වැඩිදුරටත් දේව වචනය පවසයි. **"අපි අවිශ්වාස වුනත් උන්වහන්සේ විශ්වාසව සිටින සේක. මක්නිසාද තමන්වහන්සේගේ වචනය බොරු කරන්ට උන්වහන්සේට බැරිය."** (2 තිමොති 2:13) දෙවියන්වහන්සේගේ මැවිල්ලෙහි කිරීටය වන මිනිසා හට සර්ව බලය හිමි නොවන අතර, මිනිසාගේ පැවැත්ම හා සතුට පවත්වාගෙන යාම සඳහා එක්තරා සීමිත බලයක් ඔවුන්ට පවරා තිබේ. සභාව, පවුල් ජීවිතය හා රජය පවත්වාගෙන යාමට එම බලය දී තිබේ. යේසුස්වහන්සේ කුරුසිය මත මරණයට පත්වීමෙන් පසුව උන්වහන්සේගේ ශ්‍රාවකයන් අසරණව, බිහිසුළුව, දොරගුලු ලා සැඟවී සිටියෝය. එහෙත් ශුද්ධාත්මයාණන්වහන්සේ ඔවුන් කෙරෙහි පැමිණි විට බලයෙන් පූර්ණව කටයුතු කළෝය. (ක්‍රියා 1:8) මෙම බලය අප හට උන්වහන්සේ ලබා දෙන්නේ ස්ව ගෞරවය උදෙසා නොව උන්වහන්සේව ප්‍රසන්න කරන පිණිසය.



**"එහෙයින් මම ඔබට කියමි: කුමක් කමු ද, කුමක් බොමු ද කියා ජීවිතය ගැනවත්, කුමක් අඳිමු ද කියා ශරීරය ගැනවත් කරදර නොවන්න. කෑමට වඩා ජීවිතය ද, ඇඳුමට වඩා ශරීරය ද අගනේ නොවේ ද? අහසේ කුරුල්ලන් දෙස බලන්න. උන් වපුරන්නේ වත්, කපන්නේ වත්, අටුවල රැස් කරන්නේ වත් නැත. එහෙත්, ඔබේ ස්වර්ගීය පියාණන්වහන්සේ උන් පෝෂණය කරන සේක. ඔබ ඔවුන්ට වඩා බොහෝ වටිනවා නොවේ ද?"**
(මතෙව් 6:25-26)

ගරු එස්. ඊ. ඡේබර් දේවගැති තුමා
මහනායක
ක්‍රිස්තියානි රෙපරමාදු සභාව



# බලාපොරොත්තුවෙහි පහන්
# හදවතෙහි දල්වන්න

**"මක්නිසාද අප ගළවනු ලැබුවේ බලාපොරොත්තුවෙන්ය. නුමුත් පෙනෙන බලාපොරොත්තුවක් බලාපොරොත්තුවක් නොවේය. මක්නිසාද තමාට පෙනෙන දෙයක් ගැන බලාපො-රොත්තුවෙන්නේ කවරෙක්ද? නුමුත් අපි නොපෙනෙන දේ ගැන බලාපොරොත්තුවෙමු නම් ඉවසිල්ලෙන් ඒ ගැන බලා සිටිමුව."**
රෝම 8:24-25

මට සිතෙන්නේ කෙටි මල් වැස්සකට වඩා මද පවන කෙරෙහි බලාපොරොත්තුවක් ඇතිකර ගෙන සිටීම කාලෝචිත බවයි. තාවකාලික දේට වඩා සදාකාලික දේ ගැන බලාපොරොත්තුවක් ඇතිව සිටීම කොතරම් අගනේද? එය එල දරණු ඇත. මද පවනකට පසු පැමිණෙන්නේ දිගු වැස්සක් බව ඔබ නොදන්-නෙහිද?

සිරිලක වැසියන් සියළු දෙනාම වර්තමානයේ කෝවිඩ් 19 හෙවත් කොරෝනා වසංගත උවදුරට මුහුණ දෙමින් සිටිති. මනුෂ්‍යයන් ලෙස මෙම වසංගත උවදුර ගැන බියක් හා චකිතයක් ඇතිවීම ස්වභාවිකය. නුමුත් අප බිය විය යුත්තේ වසංගත උවදුරට වඩා අප විසින් සිදුකර ඇති බරපතල වැරදි වලට නොවේද? එම වැරදි ගැන සිතා බලා පසුතැවිලි වී නැවත ඒවා නොකරන ලෙස අනතුරු ඇඟවීමක් කෝවිඩ් 19 විසින් අපට කරන බවට අප සිහිකල යුතුය.

විශ්වය මවා පාලනය කරන දෙවියන්වහන්සේට අගෞරව වන පරිදි මනුෂ්‍යයා ක්‍රියා කිරීම මෙයට හේතුවක් විය හැක. මැ-වුම්කාර දෙවියන්වන්සේගේ මැවිල්ල විනාශ කරමින් උන්වහන්සේ මැවූ ගස් කපා දැමීමත්, ගංගා, ඇළ, දොළ හා මුහුදට අපද්‍රව්‍ය එකතු කිරීම මගින් විනාශ කිරීමත්, මිනිස් ඝාතන, වංචා, දූෂණ යනාදී එකී මෙකී නොකී අහිතකර ක්‍රියාදාම වල මිනිසා නිරතවූ නිසා කෝවිඩ් 19 යනු එම වැරදි වල අහිතකර ප්‍රථිඵල පෙන්වා දෙන කැඩපතක් දැයි වරෙක මට සිතෙයි.

සිරිලක පමණක් නොව මුළු ලොව පුරාම විවිධ ගැටුම්, දරිද්‍රතා-වයන්, ව්‍යසනයන්, ශාරීරික හා මානසික අසෙනියන්, ජාතිවාද, ආගම්වාදී ගැටුම්, යුද්ධ හා කෝලහාල මෙන්ම ගෝලීය උෂ්ණත්-වය වැනි පාරිසරික ගැටළු වලටද මනුෂ්‍යයා මුහුණ දෙමින් සිටී. මේ සියල්ල ඉහත කී ලෙස මිනිසා වැපුරූ දේවල් වලම අයුතු ප්‍රතිපල වේ.

කොරෝනාව දෙස බලන විට ශුද්ධ බයිබලයේ නික්මයාම පොතේ 6 සිට 12 පරිච්ඡේද දක්වා ඇති මිසරය මුහුණ දුන් වසංගත තත්වය ගැන අපට සිහි වේ. ඵාරාවෝ රජුගේ දැඩි සිත මෙල්ල කිරීමට දෙවියන්වහන්සේ විසින් එවැනි වසංගත තත්වයක් එවූ බව එහිදී පැහැදිලිය. එදා ඒ පැවති වසංගත තත්වයටත් වඩා භයානක ලෙස කොරෝනා වසංගතය අද මුළු ලොවටම රතු එළියක් දල්වා තිබේ. එසේ නම් මෙකී උවදුරෙන් මිදීමට නම් වැදගත් කරුණු කිහිපයක් අප විසින් අනුගමනය කල යුතුය.

1. පළමුව අපගේ අචල විශ්වාසය හා බලාපොරොත්තුව දෙවියන්වහන්සේ මත තබා ගනිමින් අනෙකුත් වැඩ කිරීම අතිශය වැදගත් වේ.
2. සෞඛ්‍යය උපදෙස් ඒකමතිකව පිළිපැදීම හා ඊට කීකරුව දිවි පෙවත ගෙන යාමද ඉතා වැදගත් වේ. වෛද්‍යවරුන්, හෙදියන් ඇතුළු සෞඛ්‍යය අංශ වල නිලධාරීන් අපට සපයා ඇත්තේ දෙවියන් වහන්සේය. ඒ සෑම දෙනම අපේ යහ පැවැත්මේ සුහද මිතුරන්ය. එම නිසා ඔවුනට ඇහුම්කන් දීම ඉතා වැදගත් වේ.
3. "දිව්‍ය බලාපොරොත්තුව" වනාහී අපගේ ශරීරයට හා මනසට ශක්තිය මෙන්ම සුවය ගෙන දෙන අගනා ඖෂධයකි. එමනිසා ඇදහිල්ලෙන් හා බලාපොරොත්තුවෙන් යුක්තව ඊට මුහුණ දිය යුතු වේ.

දෙවියන්වහන්සේගේ අනුග්‍රහය තුළ මෙසේ කිරීමෙන් මෙම උවදුරෙන් ගැලවී උන්වහන්සේට ප්‍රශංසා කිරීමට හැකිවේවා යයි මම ප්‍රාර්ථනා කරමි.

**"මක්නිසාද ඉවසිල්ල කරණකොටගෙනද ලියවිලිවලින් හටගන්න සැනසිල්ල කරණකොටගෙනද අප බලාපොරොත්තු ඇතුව සිටින පිණිස, පූර්වයෙහි ලියනලද සියල්ල අපගේ ඉගෙන ගැනීම සඳහා ලියන ලද්දේය."**
රෝම 15:4

ඔබ සැමට දේව පිහිටයි.
ගරු සිරිමල් ජයලත් ද සිල්වා පියනම

# මිතුරන් සතුරන් වී, සතුරන් මිතුරන් වී ද?



**ආදරණීය තරුණ දුවේ පුතේ,**

ඔබ මෙන්ම ජීවිතයේ තරුණ වියට මුහුණ දුන්, තරුණ විය පසු කල මෙන්ම තරුණ වියේ පසු වන දරුවන් දෙදෙනෙකු සිටින මවක් ලෙස තරුණ ඔබ හට මාගේ අදහස් පළ කරන්නට ලැබීම පිළිබඳ දෙවිඳුන්ට තුති පුදමි.

තරුණ වියේ පසු වූ යේසුස් සමිඳාණන්-වහන්සේ තරුණ ඔබ හට ප්‍රේම කරන නිසාම ඔබගේ ආරක්ෂාව උදෙසා ශුද්ධ ලූක් 15 : 11 - 32 දක්වා අකීකරු තරුණ පුත්‍රයෙකුගේ වැටීම පිළිබඳ උපමා කතාවක් දේශනා කර ඇත. මෙම උපමාව තුළ තරුණ ඔබ වැටීමට පෙර ගන්නාවූ වැරදි තීරණ හා පියවර පෙන්වා දී ඇත. ඔබගේ ජීවිතය තුළ මෙවැනි ගති පැවතුම් ඇත්දැයි සිතා බලන්න.

**"තවද උන්වහන්සේ කියන සේක්, එක්තරා මනුෂ්‍යයෙකුට පුත්‍රයෝ දෙදෙනෙක් සිටියෝය. ඔවුන්ගෙන් බාලයා: පියාණෙනි, ඔබගේ වස්තුවෙන් මට එන කොටස දෙන්නැයි පියාට කීවේය. එවිට ඔහු තමාගේ සම්පත් ඔවුන්ට බෙදා දුන්නේය. නොබෝ දවසකට පසු බාල පුත්‍රයා සියල්ල එකතු කරගෙන, දුර රටකට ගොස්, එහිදී අවකල් ක්‍රියාවෙන් ජීවත්වෙමින් තමාගේ වස්තුව නාස්ති කෙළේය."**
(ලූක් 15:11- 13)

එක්තරා ධනවත් පියෙකුට තරුණ පුතුන් දෙදෙනෙකු විය. කිසිඳු යහපත් දෙයකින් අඩුවක් නොවූ මෙම නිවසේ බාල පුත්‍රයා තමන්ට හිමි උරුමය ඉල්ලා තම පියා සමග සටන් කළ අතර එය ලබා ගන්නට විය.

**මෙම තරුණයා ගත්තාවූ පළමු වැරදි තීරණය නම් තම පියා විසින් ඔහුට හිමි උරුමය ලබා දීමට පෙර ලබා ගැනීමය.** තරුණ වියට පා තැබීමත් සමගම ජීවිතයේ ඇති වන්නාවූ තරුණ ආශාවන් හා පොරබැදීම් නිසා තරුණ ඔබත් ඔබගේ උරුමය අයිතිවාසිකම් උදෙසා තම දෙමව්පියන් සමග සටන් කරන්නෙක්ද ? ඔබගේ දෙමව්පියන් විසින් එය ලබා දීම හා ඔබ විසින් ලබා ගැනීම යනු කාරණා දෙකකි. ඔබට හිමි උරුමය ඔබ විසින් උදුරා ගැනීම නොව දිනා ගැනීම දේව කැමැත්ත වේ. එනම් තරුණ ඔබත් ඔබ සතු අයිතිවාසිකම් උදෙසා සටන් කරන්නෙක්ද? එනම්, "දැන් මම ලොකුයි, මට වයස 18 ට වැඩියි, හොඳ නරක හොඳින් තේරෙනවා, මම කැමති දෙයක් කරන්නට මට නිදහස තියෙන්නට ඕනි" වැනි ප්‍රකාශන මේ අතුරින් කිහිපයකි.

**මෙම තරුණයා ගත් දෙවන වැරදි තීරණය නම් තම නිවස අතහැර යාම වේ.** එනම් තමන් ගැන සොයා බලන තමන්ට නීති හා සීමාවන් පනවන තම පියා සහ නිවස අත්හැරීමයි. ඔබත් ඔබගේ නිවස අත්හැරීමට කැමති තරුණයෙක් දැයි මදක් සිතන්න. තම පියාගෙන් නිදහස් වීම ඔහුගේ කැමැත්ත විය. ඔබත් නිදහස සොයන්නාවූ තරුණ තරුණියක් ද ?

දුවේ පුතේ, දේව වචනයේ නිදහස යන්නෙන් අදහස් කරන්නේ ඕනෑම දෙයක් කරන්නට ලැබෙන නිදහස නොව නිවැරදි දේ කරන්නට ලැබෙන නිදහස පිළිබඳවයි.

**"සියලු දේ ගැන මට නිදහස තිබේ. නුමුත් සියල්ල ප්‍රයෝජන නැත. සියලු දේ ගැන මට නිදහස තිබේ: නුමුත් මම කිසිවකට වසඟ නොවන්නෙමි."**
(1 කොරින්ති 6:12)

**මෙම තරුණයා ගත්තාවූ තෙවන වැරදි තීරණය නම් ඈත රටකට ගමන් කිරීමය.** ඔහු ඈත රටකට ගියේ මන්ද ? එවිට තමන්ට රිසි දේ කරමින් විනෝද වන්නට නිදහස ඇත. ඔබත් ඔබගේ දෙමව්පියන්ගෙන් හා නිවසින් ඈතට යන්නට කැමති තරුණයෙක්ද? එසේත් නැතිනම් මේ මොහොත වන විටම තමන්ගේම අයගෙන් දුරස්ව සිටින්නෙක්ද? නැතිනම් නිවසේම ජීවත් වුවත් පවුලේ අයගෙන් ඈත්ව හුදකලාව ජීවත්වන්නෙක්ද?

**මෙම තරුණයා ගත් සතර වන වැරදි තීරණය නම් වැරදි මිතුරන් හා සමග වැරදි ක්‍රියාවන් වල යෙදීමයි.** බොහෝ තරුණ ජීවිත විනාශ වී ඇත්තේ ඔවුන් විසින් තෝරා ගන්නා ලද වැරදි මිතුරන් නිසාවෙනි. ඔබ ඇසුරු කරන මිතුරන් ගැන මොහොතක් සිතන්න. දේව වචනය අවවාද කොට ඇත්තේ "**දුෂ්ටයන්ගේ මන්ත්‍රණය අනුව නොයන්න, පවුකාරයන්ගේ මාර්ගයෙහි නොසිටින්න හා නින්දා කරන්නන්ගේ ආසන-යෙහි නොරැඳෙන්න**" යනුවෙනි.
(ගීතාවලිය 1:1) සියලුම වස්තුව අවසන් වූ පසු ඔහුගේ මිතුරන් ඔහුව අතහැර ගියේය. මොහොතකට නැවතී සිතන්න. ඔබ ඇසුරු කරන්නේද ඇති විට ඇති, නැති විට නැති මිතුරන් හා සමගද කියා. **තරුණ ඔබ තෝරා ගත යුත්තේ ඔබ සිනාසෙන විට ඔබ හා සමග සිනාසෙන, ඔබ හඬන විට ඔබ හා සමග හඬන, ඔබ අධෛර්‍යමත් වී සිටින විට ඔබව ධෛර්‍යමත් කරන, ඔබ ණය බරින් සිටින විට ඔබට උපකාර කරන හා ඔබ වරදකට පෙළඹෙන්නට යන විට එම වරද පෙන්වා දෙන මිතුරන්ය. එවන් මිතුරන් ඔබට සිටීද** ?

අවසානයේදී මෙම තරුණයාට සිදු වුයේ සියලු වස්තුව අහිමි වී සියලු මිතුරන්ද නැති වී ඌරන් කන කෑම කමින් ඌරු කොටුවක කාලය ගත කිරීමටය. එලෙස සිදු වුයේ තම පියාව හා නිවස අතහැර යෑම, වස්තුව නැති නාස්ති කිරීම, වැරදි මිතුරන් ආශ්‍රය කිරීම සහ වැරදි ක්‍රියාවන් වල යෙදීමය. එසේ කිරී-මෙන් තම පියාගේ වස්තුවද විනාශ කරමින් තමන්වද විනාශ කර ගත්තේය. මොහොතක් සිතන්න. තරුණ වියේ පසුවන ඔබටත් මෙසේ විය නොහැකිද ?

තරුණ වියේ පසු වූ යේසුස්වහන්සේ තරුණ ඔබ හට ප්‍රේම කළ නිසාම ඉහත කී උපමාව තුලින් අවවාද කොට ඇත. **මන්ද මෙහි තරුණයා මෙන් "රෑ වැටුණු වලේ තරුණ ඔබ දවල් වැටෙන්නට" උවමනා නැත.**

රෝහිනී පෙරේරා මිය
සුබ අස්න කාර්යාලය

ආදරණීය දුවේ පුතේ,

අපි ජීවත්වන මේ ලෝකය දෙවියන්වහන්සේ මවනු ලැබූ බවත්, ආදම් සහ ඒව වගේම ඔවුන්ගේ වැඩිමහල් පුත් කායින්ගේ අකීකරුකම් නිසා ඔවුන් දඬුවම් ලැබූ ආකාරයත් පසුගිය කලාපයන් වලින් අප ඉගෙන ගත්තා ඔබට මතක ඇති.

අද අපි ශුද්ධ බයිබලයේ උත්පත්ති 6, 7, 8 පරිච්ඡේද වල සඳහන් වන

## නෝවාගේ කාලයේ ඇති වූ ජල ගැලීම ගැන ඉගෙන ගනිමු.

දෙවියන්වහන්සේ ආදම් සහ ඒව මවලා වසර ගණනාවක් ගතවන විට සෙනඟත් එන්න එන්නම වර්ධනය වුනා. ඒත් මේ සෙනඟ දෙවියන්වහන්සේගෙන් ඈත් වෙලා තම තමන් කැමති විදියට තමයි ජීවත් වුණේ. මේ ගැන දුක් වූ දෙවියන්වහන්සේ ඔවුන්ව විනාශ කරන්න තීරණය කළා. හැබැයි මේ සෙනඟ අතර නෝවා පමණක් ධර්මිෂ්ඨව ජීවත් වුනා. ඒ නිසා අලුත් ආරම්භයකට උන්වහන්සේ නෝවාව තෝරා ගත්තා.

දිනක් දෙවියන්වහන්සේ නෝවාට "නැවක් සාදන්න. ඒ නැවට සෑම වර්ගයකම සතුන් දෙදෙනා බැගින් ඇතුල් කරන්න" යැයි පැවසුවා. නෝවා ද කීකරුවී උන්වහන්සේ කී ලෙස නැව සාදා, සියළු සතුන් අතරෙන් දෙදෙනා බැගින් නැවට ඇතුල් කළා. ඉන් අනතුරුව නෝවා හා පවුලේ අයද නැවට ඇතුලු වුනා.

මොවුන් නැවට ඇතුළු වී දොර වැසුවාත් සමගම විශාල වර්ෂාවක් ඇද හැලුනා. වැස්ස.... වැස්ස.... එක දිගටම වැස්ස. මොර සූරණ වැස්ස. දින හතළිහක් එක දිගටම නොනැවතී වැසි වැස්ස නිසා මුළු පොළොවම කඳු පවා නොපෙනෙන තරමටම ජලයෙන් යට වුනා. නමුත් නැව තුළ සිටි සියළු දෙනාම ආරක්ෂා වුනා.

වර්ෂාව මුළුමනින්ම නැවතුනාට පස්සේ නැව කඳු මුදුනක නතර වුනා. නෝවා පරෙවියෙකු නැවෙන් පිටතට යැව්වා. ඌ හැම තැනකම පියාසර කර පය තබන්නට තැනක් නොලැබුණු නිසා නැවත පැමිණියා. තවත් සතියකට පසු නෝවා නැවතත් පරෙවියා පිටතට හැරියා. එවර ඌ ඔලීව කොළයක් රැගෙන ආවා. එවිට නෝවා පොළොවේ ජලය බැස ගොස් වියළී ඇති බව වටහා ගත්තා.

දෙවියන්වහන්සේ නෝවාට පවුලේ සැම හා සියළු සතුන් පිටතට ගෙන එන්න යි කීවා. ඔවුන් පිටතට එන විට අහසේ විශාල දේදුන්නක් තිබුණා. නැවත පොළොව ජලයෙන් විනාශ නොකරන බවට සළකුණක් කොට උන්වහන්සේ එය අහසේ තැබුවා.

ආදරණීය දුවේ පුතේ, අපි දෙවියන්වහන්සේ කැමති විදියට ජීවත් වෙන්න ඕනි. අපි උන්වහන්සේට කීකරුව ජීවත්වන විට භයානක දේවල් වලින් පවා අපව ආරක්ෂා කරන්න උන්වහන්සේට පුළුවන්. අදින් පස්සේ ඔයාලා අහසේ දේදුන්නක් දකින හැම වෙලාවකම දෙවියන්වහන්සේ නෝවාට දුන්නු පොරොන්දුව සිහි කරන්න.

මිහිරි නැන්දා






මෙම රූපය තුළ සැඟවුණු රූප සොයා සළකුණු කොට අප වෙත එවන්න.

බයිබලය

බෝංචි ඇටය

මේස් කකුල

ඩයිනසෝර්

නම : ..........................................

වයස : ..........................................

උපන් දිනය : ..............................

(පවතින වසංගත තත්වය හේතුවෙන් ඔබගේ පිළිතුරු වට්ස්ඇප් (whatsup) මගින් 0773952924 අංකය හරහා අප වෙත එවිය හැක.)

**පසුගිය කලාපයේ නිවැරදි පිළිතුරු...**




පසුගිය කලාපයෙහි පිළිතුරු එවූ දරුවන් :

එම්. ඒ. කෙනුල්

සෙනුර උමයංගන

ජොයෙද් ඩිෂෝන්

ස්ටෙෆාන් රත්නායක



# සදාරක්ෂිත සොල්දාදුවා

"එබැවින් නුඹලාගේ ඉඟටි සැබෑකම නැමැති පටියෙන් බැඳගෙන ධර්මිෂ්ඨකම නැමැති ළය වැස්ම පැළඳ ගෙන, සමාදානයේ සුභාරංචියේ සූදානම නැමැති වහන් පය ලා සිටින්න. ඒ සියල්ල ඈර, ඇදහිල්ල නැමැති පළිහ අරගන්න. එයින් නපුරාගේ සියලු ගිනිහෙල්ල නිවන්නට නුඹලාට පුළුවන් වන්නේය. ගැළවීම නැමැති ආරක්ෂා තොප්පියද දෙවියන්වහන්සේගේ වචනය නැමැති ආත්මයාණන්වහන්සේගේ කඩුවද ගන්න."

-එපීස 6 : 14 - 17-

කිතුණුවා අමුතු සොල්දාදුවෙකි. සත්‍යවශයෙන්ම කිවතොත් ඔහු අංග සම්පූර්ණ සොල්දාදුවෙකි. ඔහුට අවශ්‍ය සෑම අවියක්ම හා ඇඳුමක්ම රාජ්‍ය අනුග්‍රහයෙන් ලැබී ඇත. තවද ඔහු නිල වශයෙන් මෙම කණ්ඩායමට එකතු වන විට ඔහුගේ උපකාරයට විශ්වයේ මෙතෙක් සිටින ප්‍රබලම සටන්කරුවාණන්ගේ බලවන්ත ආත්මය, සියළු බලය සහිතව ඔහු තුළ තබා ඇත. ඔහුගේ සටන මහ පුදුමාකාරය. මෙම මහා සටන ඔහු කණ්ඩායමට බැඳුණු දවසේ පටන් ආරම්භ වේ. ඔහුට පුහුණුවක් ඇත. නුමුත් පුහුණුවීමට කාලයක් නොමැත. ඔහුගේ පුහුණුව සිදුවන්නේ සටන්බිම තුලය.

ඔහුගේ සතුරන් ඔහු ඉතා හොඳින් හඳුනන මිතුරන් පවා විය හැක. ස්වභාවයෙන්ම සතුරු වේෂය දරන සතුරන්ගෙන්ද භිගයක් නැත. ඔහුගේ සතුරන් බොහෝ විට මිතුරන් සේ වෙස්වලා සිටියි. තවත් විටක වෙනත් රූපයකින් සැඟවී සිටී. මෙම සතුරන් හඳුනා ගැනීම ඔහු විසින්ම කල යුතුය. ප්‍රීතියට ඇති කරුණ නම් එයට අවශ්‍යය උපදෙස් ඔහුට අනුග්‍රහයෙන් ලිඛිතව ලබා දී ඇත. උපදෙස් අනුගමනය කරන තාක් ඔහු සාර්ථකව සටන් කරයි. **සටන හඳුනා ගත හැක්කේද, සතුරා හඳුනාගත හැක්කේද, එපමණක් නොව ස්වකීය බලය හඳුනාගත හැක්කේද ලිඛිත උපදෙස් අනුගමනය කිරීමෙන් පමණි.**

ඔහු තුළ සිටින බලවන්තයාණන් ඔහුට එම උපදෙස් මනාව වටහා දෙයි. මෙම උපදෙස් වාක්‍යයේ බලයෙන් හා ඔහු තුළ සිටින බලවන්තයාණන්ගේ ශක්තිය මෙම කිතුණුවා හසුරුවයි. මෙම යුගලයෙන් කිතුණුවා ඈත්වන විට සතුරාට හා සතුරන්ට ඔහුට පහරදීමට අවකාශ විවෘත වේ. ආශිර්වාදයකි ! එනම්, විරුද්ධකරුවන්ට කිතුණුවා නැසිය නොහැක, නමුත් පහර එල්ල කල හැක. **එම එල්ලවන පහර කිතුණුවාට බාධාවක් වන්නේ කිතුණුවාගේ වරදින් මිස විරුද්ධකාරයා ඔහුට වඩා ශක්තිමත් නිසා නොවේ.**

කිතුණුවාට තවත් ප්‍රධානතම සතුරෙක් සිටී. එම සතුරා නම් ඔහු මෙම කණ්ඩායමට බඳවා ගැනීමට පෙර සතුරු වේශයක් දැරූ ඔහු තුළ සිට මළ ඔහුමය. ඔහුගේම පෙර ස්වභාවය ඔහු තුළ සිට ඔහුට බාධා කරයි. ඔහු සතු නව නිලය හා ඉරණම අමතක කරවීමට බලපෑම් කරයි. ඔහුගේ පරණ මිතුරන්, නොහොත් නව සතුරන් නැවත ඔහු හා මිතුරු කිරීමට උත්සාහ කරයි. නමුත් කිතුණුවා ඔහු පරාජය කළ යුතුය. මන්ද එය බලරහිත ඔහුගේ මැරුණු ස්වභාවයයි. එයට හඬක් ඇතිමුත් පණක් නොමැත. තවත් එය ඔහුව ආණ්ඩු නොකරයි. මෙම සත්‍යය තම මනස අලුත් කරගනිමින් වටහා ගැනීම ඔහු සතු වගකීමකි.

කිතුණුවාගේ කණ්ඩායමේ තවත් සොල්දාදුවෝ සිටිති. කිතුණුවාට තම තනි සටන හැරුණු කොට මෙම සහෝදර සොල්දාදුවන් සමඟ පොදු සටනක්ද නියම වී ඇත. ඔවුන්ගෙන් උපකාර මෙන්ම ශක්තිමත් වීමද කිතුණුවාට උපකාරී වේ. **කිතුණුවාට මෙම පොදු සටන මගහැරිය නොහැක. මන්ද පොදු සටන හා පුද්ගලික සටන යන දෙකෙහිම අවසාන පරමාර්ථය එකකි. අනිත් සොල්දාදුවන්ට උපකාර කිරීම ඔහු සතු පැහැර හැරිය නොහැකි වගකීමකි. ඔහු එය කළ යුතුමය.**


සටනක් නොමැති සේ දැනෙන භයානක නිශ්ශබ්ද කාලයන් වලදී ඔහුගේ සටන ක්‍රියාත්මකය, එසේ නොමැතිනම් ඔහුගේ සටන මහා වියවුල් ප්‍රචණ්ඩ සංග්‍රාමයක් විය හැක. ඇතැම් සටන් කාල වල ඔහු ඉතා බෙලහීන වේ. ඔහු කටුක යුදපිටි වල තනිව ගමන් කරයි. එම ප්‍රදේශයන්හී සතුරන්ද බහුලය. සහෝදර සොල්දාදුවන්ද පෙනෙනතෙක් මානයක නොමැත. ඔහු තුවාල වී ඇත. ඔහුට ඔහුගේ ශක්තියෙන් යා නොහැකි තරම්ය. අහෝ මේ කිතුණුවාට උපකාර කරන්නේ කවුද? ආශ්චර්යයකි, ඔහු සතුව ඇති වැදගත්ම ආයුධය දැන් ඔහුට උපකාරී වේ. මෙම ආයුධය ඔහු තුළ බලාපොරොත්තුවක් ඇති කිරීමට පටන් ගනියි. ඔහුව ශක්තිමත් කරයි. ඔහු දැන් කෙමෙන් කෙමෙන් බෙලහීන දණහිස් සවිකර ගනියි. එම ආයුධය නම් ඔහු නිල වශයෙන් සේවය කරන රාජ්‍යයේ නායකයාණන්ගේ විශ්වාසවන්ත භාවයයි. ලිඛිත උපදෙස් තුලින් මේ විශ්වාසවන්තභාවය ප්‍රකාශ වෙයි. නායකයාණන් සටනට අවශ්‍ය සෑම දේ සපයමින්, සටනේ සෑම අවස්ථාවකම ඔහුගේ නුදුරින් සිටින බව එහි පවසා ඇත. ඇස් වලට පෙනෙන්නේ නැත. නමුත් විශ්වාස කළ යුතුය. මන්ද කිතුණුවාට පෙර මෙම සටනෙන් මැරුණු බොහෝ සොල්දාදුවෝ එම විශ්වාසවන්තභාවය සනාථ කර ඇත. **එතුමාණන් කිසි විටෙක තම සොල්දාදුවන් තනි කර නැත. අත්හැර නැත. මන්ද එම සොල්දාදුවන් උන්වහන්සේගේය. එම අමාරු අවදියේ කිතුණුවා එය විශ්වාස කළ යුතුය. විශ්වාසය යනු කිතුණු සොල්දාදුවෙකුගේ තැනුම් ඒකකයයි. එසේ කරන මොහොතේ පටන් ඔහුගේ තුවාල සුව වීමට පටන් ගනියි. මහා ප්‍රීතියක් ඔහුව තවත් ශක්තිමත් කරයි. ඔහුද ඉදිරියට යයි. කිතුණු සොල්දාදුවා නිර්භීත විය යුතුය. එසේ කළ හැක්කේ ඔහු සතු පුහුණුව, ශක්තිය හෝ නිලය විශ්වාස කිරීමෙන් නොව, ඔහුගේ නායකයාණන්ගේ ශක්තිය, බලය හා නිලය, සෑම සතුරෙකුගෙන්ම ඔහුව ආරක්ෂා කිරීමට ප්‍රමාණවත් බව එත්තු ගැනීමෙනි.**

ජීවත්ව සිටිනතාක් ඔහුගේ සටන කෙළවර නොවේ. නිහඬ නිශ්චල කාලයන් වල සටන ඉතා ප්‍රබලය. මක්නිසාද ඔහු සටනක සිටින බව ඔහුට අමතක වීම මෙකී කාලයේදී සිදුවිය හැක. **දිනපතා හැකි සෑම මොහොතකම ඔහු මූලස්ථානයේ සිටින තම අණ දෙන නිලධාරියාණන්වහන්සේ සමඟ සම්බන්ධ වීම කළ යුතුමය. ලිඛිත උපදෙස් කියවිය යුතුය.** ඒවායේ රහස් දත්ත සෙවිය යුතුය. කඩින් කඩ පැවැත්වෙන කණ්ඩායම් රැස්වීම් වලට සහභාගී විය යුතුය. ඔහු අවදියෙන් සිටින්නේ එවිටය.

අධිපතියාණන්වහන්සේගේම ස්වරූපය වූ නායකයාණන්වහන්සේගේ ස්වරූපයට සමාන වීම හා උන්වහන්සේ මෙන් සටන් කිරීම අධිපතියාණන්වහන්සේගේ පෙර නියමයයි. මරණයෙන් පසු ඔහුට එම නායකයාණන්ගේ රාජාභිශේකයේ මහිමය තුළ සිටීමට සදහටම ඔහුව එම සදාකාලික, සතුරන් විරහිත, පීඩා විරහිත, සුන්දර රාජ්‍යයට උන්වහන්සේ පැමිණ රැගෙන යයි. එය සෑම සොල්දාදුවෙකුගේම අවසාන බලාපොරොත්තුවයි. කෙසේ හෝ සටනේ ප්‍රධානතම අරමුණ වන්නේ අධිපතියාණන්, නායකයාණන් තුළ මහිමයට පත්වීමයි. මේ කිතුණු සොල්දාදුවන් කළක් දුර්වල ස්වභාවයෙන් උන්වහන්සේට සතුරන්ව සිටි සමයේ, උන්වහන්සේගේ රාජ්‍යයේ මිතුරන් හා දරුවන් වීමට තම පුත්‍ර නායකයාණන්ගේ ජීවිතය දී සදහටම සටන කෙළවර කරමින් මේ කිතුණුවාගේ සටන කිතුණුවා වෙනුවෙන් උන්වහන්සේම ජයග්‍රහණයෙන් හමාර කළ සේක. **ඔව්, සැබවින්ම එය විශ්මයජනකය, පුදුම සහගතය, ප්‍රේමනීයය. එනම්, කිතුණුවා සටන් කරන්නේ ජයග්‍රහණය කර හමාර වූ සටනක්ය.**

ස්වර්ගයේ වැඩවසන අපගේ අධිපතියාණන්වහන්සේ වන
පියවූ දෙවියන්වහන්සේටත්, නායකයාණන්වහන්සේ වන
පුත්‍රවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේටත්, බලවන්තයාණන්වහන්සේ
වන ශුද්ධ වූ ආත්මයාණන්වහන්සේටත් සදාකාලයෙන්
සදාකාලයටම මහිමය වේවා !
ආමෙන්.

ඩබ්ලිව්. පී. විශ්ව ශක්ති



# ක්‍රිස්තු චරිතය තුළ
# අපගේ චර්යාව

(පසුගිය කලාපය හා සම්බන්ධයි. යොහන් ශුභාරංචිය ඇසුරිනි)



**5. යේසුස්වහන්සේගේ ප්‍රමුඛතාවයන් හා මූලධර්ම.**

යේසුස්වහන්සේගේ චරිතය තුළ උන්වහන්සේගේ සේවය අලංකාර කිරීමට පැහැදිලි ප්‍රමුඛතාවයන් හා මූලධර්ම තිබුණු බව යොහාන් ශුභාරංචිය සනාථ කරයි. මෙම ප්‍රමුඛතාවයන් හා මූලධර්ම අතර බැඳීමක් දක්නට ඇත. උන්වහන්සේගේ සේවයේදී මේවා විවිධ ප්‍රජාවන්, නායකයන් හා ප්‍රේරිතයන් අතර විවිධත්වයකින් ප්‍රකාශ වූ අතර ඒවා පරිපූර්ණ හා යහපත් ඒවා විය. අප මෙය මාතෘකා දෙකක් යටතේ අධ්‍යයනය කරමු.

**ප්‍රමුඛතාවයන්**

පළමුකොට පියාණන්වහන්සේ සමඟ බැඳීම, පියාණන්වහන්සේ මත යැපීම, පියාණන්වහන්සේගේ මඟපෙන්වීම. පියාණන්වහන්සේ සමඟ තිබූ අතිවිශේෂ සම්බන්ධතාවය හා කීකරුකම සියළු මනුෂ්‍යයන්ට හා ප්‍රේරිතයන්ට උන්වහන්සේගේ ප්‍රමුඛතාවය මන්ද යන්න පෙන්වා තහවුරු කළේය. පියාණන්ගේ මහත් ක්‍රියාවන් ආවර්ජණය කරමින් නිතර පියාණන් හට යාච්ඤා කල උන්-වහන්සේ, පියාණන්ගේ නියෝජිතයා හා පුත්‍රයාණන් බව ප්‍රකාශ කළ සේක (6:34 සිට 8:1-2, 14:6 සිට 17:1-5, 5:17 සිට).

දෙවනුව පරණ ගිවිසුම හා එහි චරිත වන දාවිත්, ආබ්‍රහම් හා මෝසෙස් වැනි අය උන්වහන්සේගේ චරිතය හා සේවයේ හැඩය පෙන්වා දුන්නෝය. තවද එම ප්‍රකාශන මගින් උන්වහන්සේගේ අනන්‍යතාවය, ආධිපත්‍යය, මෙසියස්භාවය හා ස්වාධීනත්වය ස්ථිර කළෝය (5:46, 6-8 පරි). එමෙන්ම උන්වහන්සේගේ දේවත්වය හා මනුෂ්‍යත්වය පහදා දෙමින් පියාණන්වහන්සේ වෙතට එමට ඇති එකම සත්‍ය මාර්ගය තමන්වහන්සේ බව ප්‍රකාශ කළේය. (1:1, 9, 12, 14, 18, 29,14:6).

තෙවනුව උන්වහන්සේ යුදෙව් මංගල්‍යයන්ට ගෞරවපූර්වකව සහභාගිවෙමින් ඒවා තුළ උන්වහන්සේගේ ස්වාධීනත්වය, බලය හා ආධිපත්‍ය කියා දුන් සේක. (කූඩාරම්-කැපකිරීමේ-පාස්කු මංගල්‍යවල-7-2 සිට 10-22 සිට 64). උන්වහන්සේ ඉතා සංවර ලීලාවෙන් එම අවස්ථාවන් වල ක්‍රියා කළ සේක.

සිව්වෙනුව ලකුණු හා දේශනා, ඉගැන්වීම හා සංවාද තුලින් උන්වහන්සේ ප්‍රජාවන්, නායකයන් හා ප්‍රේරිතයන් ශක්තිමත් කර, ජීවිතයට නව දැක්මක් ලබා දුන් සේක. (ලකුණු 7, දේශනා 7, ගෝලයන්ට දුන් දේශනා (යොහන් 2-11, 13-17 පරි). මෙහිදී උන්වහන්සේගේ දුක්විඳීමේ කාලය, මරණය හා උත්ථානයට බැඳී සිද්ධීන් පෙන්වා දීමටද අමතක කළේ නැත (යොහන් 18-21). එතුමාගේ ප්‍රමුඛතාවයන්, එතුමාගේ සේවයට ශක්තියක් හා ප්‍රගතියක් විය.

**මූලධර්ම**

උන්වහන්සේ අර්ථවත්, අත්‍යාවශ්‍ය හා අතිවිශේෂ මූලධර්ම, සේවයේ සංදර්භයට අනුව ප්‍රචලිත කළේය (උදා: විවාහ මංගල්‍යයේදී, ළිඳ ළඟදී, පොකුණ ළඟදී, උත්සවයන් හිදී හා අවමංගල්‍යයේදී පරි 2, 5, 4, 7-9, 11). උන්වහන්සේගේ මූලධර්ම ඉතා ප්‍රයෝජණවත්, ප්‍රගතශීලී, ඵලදායී හා ප්‍රායෝගික ඒවා විය.

මෙහිදී අප සිදුවීම් තුනක් අවර්ජනය කර බලමු. උන්වහන්සේට ළිඳ ළඟ හමුවූ කාන්තාවට ලබා දුන් සේවයේදී උන්වහන්සේ ඇයට පෙන්වූ ගෞරවනීය බව, අර්ථවත් භාෂාවල විචක්ෂණකම, ඉතා ධනාත්මක විය. එසේම පොකුණ ළඟ සිදු වූ සුවකිරීම අතරතුර එයට අවතීර්ණ වූ ආකාරය, සංවරවූ සංවාද විලාසය හා සුව කිරීමේ ක්‍රියාවලියද ඉතා අභියෝගමත්ය. ලාසරුස්ගේ අවමංගල්‍යයට අවතීර්ණ වීමේදී ඇතිවූ සංවාද, සංවේදීභාවය, භාවිතා කල සංවර භාෂා විලාසය හා සමුගැනීමද ආදර්ශමත්ය. සැබවින්ම කිතුණු ප්‍රමුඛතාවයන් හා කිතුණු මූලධර්ම කිතුණු සේවයට ලබා දෙන්නේ ශක්තියකි. යේසුස්වහන්සේ එයට අපගේ ආදර්ශයයි.

**6. යේසුස්වහන්සේගේ පෙර සූදානම හා ප්‍රගතියට දුන් අවධානය.**

යොහන් සඳහන් කරන ආකාරයට සේවය සඳහා ගෝලයන් සූදානම් කිරීම තුල ගෝල පිරිසට ආදර්ශයක් දීම සඳහා උන්වහන්සේ විසින් ඔවුන්ගේ පාද සේදීම, උත්ථානය පෙරතියා ගෝලයන්ට ප්‍රකාශ කිරීමට මග්දලා මරියා එවීම, යන සිද්ධීන් උන්වහන්සේ පෙර සූදානමකට අවධානය දුන් බව පැහැදිලිය. තවද දුක් විඳීමට හා මරණයේ සේවයට මුහුණදීමට පෙරතියා යෙරුසලමට යෑම, වතුර මුද්‍රිකපානය කිරීම හා පන්දහසකට කන්න දීමට පෙර උන්වහන්සේ දැක්වූ සූදානම මෙයට තවත් සාක්ෂි කිහිපයකි

සේවාවන් වල පෙර සූදානම තිබුණු නිසා උන්වහන්සේට සේවය සම්පූර්ණ කිරීමට හැකි විය. උන්වහන්සේ විටින් විට ලබා ගත් නිවාඩු හා පියාණන් සමඟ යැදුම් කාලයන් මෙකී පෙර සූදානමට

උපකාර විය. මීට අමතරව උන්වහන්සේ ඉගැන්වීම් සංනිවේදනය කිරීමේදීද පෙර සූදානමක් තිබුණු බව ඉතා පැහැදිලිය.

උන්වහන්සේ විසින් කල සෑම කාර්යයක් තුළම ප්‍රගතියක් බලා-පොරොත්තු වූ බව දැකිය හැක. ලකුණු සිදු කිරීමේදී, ඉගැන්වීම් හා සංවාද කිරීමේදී, මරණය හා උත්ථානය තුළදී පවා මෙකී ප්‍රගතිය උන්වහන්සේ බලාපොරොත්තු විය.

උන්වහන්සේ විසින් ප්‍රගතිය සාක්ෂාත් කිරීමට කැපවූ බවත්, ශක්තිමත්ව සිටි බවත්, පියාණන් තුළ යැපුණු බවත්, ඉතා මැනවින් කාලය පාලනය කළ බවත් සහයෝගයෙන් හා සහජීවනයෙන් වැඩ කළ බවත් පෙනී යයි. පෙර සූදානම හා ප්‍රගතියේ දැක්ම තුලින් දිරිය හා දිනුම ලබා ගත හැක. කිතුණු පෙර සූදානම හා ප්‍රගතිය කරා අප වැඩ කරමු.


**7. යේසුස්වහන්සේගේ පරිශුද්ධ සේවය, බලයෙන් හා ඉවසීමෙන් සිදුකළ සේක.**

ක්‍රිස්තුස්වහන්සේ ව්‍යාජ හෝ ගුප්ත බලයකින් නොව දෙවියන්-වහන්සේගෙන්ම වූ පවිත්‍ර පරිපූර්ණ බලයෙන් මනුෂ්‍යයන්ට සෙනෙහස, සතුට, සහනය, සමාදානය හා සමෘද්ධිය තිලිණ කළ බව යොහන්ගේ ශුභාරංචිය පවසයි (2-11, 13-17). උන්වහන්සේ විසින් පරිශුද්ධ වචනය සංනිවේදනය කිරීමේදී බලයෙන් යුතුව එය ප්‍රකාශ කළ සේක. එය ඉතා සංවරව හා නිහතමානිව ප්‍රකාශ කළ අතර එයින් අයුතු ප්‍රයෝජන ගත්තේ නැත. උන්වහන්සේ තමන්ගේ පරිශුද්ධ චරිතයට පටහැනිව බලය විදා පාන්නේ නැත. කිතුණුවන් වූ අපද දේව බලය ඉතා අලංකාරවල විනයානුකූලව ප්‍රකාශ කිරීමට වෑයම් කළ යුතුය. උන්වහන්සේ සේවා අවස්ථාවල මුහුණ දුන් මත අරගල (4:31-34), ව්‍යාජ ක්‍රියා (6:15), තර්ජණ (8:3-4), වැරදි යෝජනා (12:4-7), ගෝලයන්ගේ බිය :14:1 සිට), අත්අඩංගුවට ගැනීමේ දී (18:1 සිට), නඩුව ඇසීමේ දී (18:9-24, 28-37) කුරුසියේදී (19:16-37) හා උත්ථාන සිද්ධීන්වල (පරි 20-21) ඉතා ඉවසීමෙන් යුතුව ක්‍රියා කළේය. දේව බලය ප්‍රකාශ කරන අතරම මනුෂ්‍යයන්ගේ, ගෝලයන්ගේ හා නායකයන්ගේ සීමිතකම ඉදිරියේදී පවා ඉතා ඉවසීමෙන් ක්‍රියා කළසේක. කිතුණු අපද දේව බලය ප්‍රකාශ කළ යුතු අතර එය ඉතා ඉවසීමෙන් හැසිරිය යුතුය. එමගින් කිතුණු සේවය ඵලදායී කරගත හැක.


**8. යේසුස්වහන්සේ විසින් පියාණන්වහන්සේගේ ප්‍රශංසාවට අවධානය දීම.**

යොහන් පොත හා සංදර්ශක ශුභාරංචි උන්වහන්සේගේ උත්තරීතර විවිධ සේවාවන් හා ආශීර්වාද ඉතා අර්ථවත්ව සටහන් කර ඇත. නුමුත් උන්වහන්සේ මේ සියලු දේ කිරීමේ දී මනුෂ්‍යයන්ගෙන්, නායකයන්ගෙන් හෝ ගෝලයන්ගෙන් ස්වකීය ගෞරවය ලැබීමට වඩා උන්වහන්සේ එවූ පියාණන් වහන්සේගේ ගෞරවය ලබා දීම අපේක්ෂා කළ සේක. කිතුණු-වාද ප්‍රසිද්ධිය හෝ ප්‍රශංසා අරමුණු කරගෙන කිතුණු සේවය නොකළ යුතුය. කිතුණුවාගේ සේවයේ පරමාර්ථය විය යුත්තේ දෙවියන්වහන්සේගේ මහිමයයි. අපි උන්වහන්සේගේ නාමයේ ප්‍රගතිය තුළ ප්‍රීතිමත් වෙමු.
සත්‍යයෙන් යේසුස්වහන්සේගේ පරිශුද්ධ චරිතය අවබෝධ කරගෙන අපගේ කිතුණු චර්යාව වර්ධනය කරමු. ක්‍රිස්තුස්-වහන්සේගේ අනුග්‍රහයෙන් අපගේ ජීවිත අර්ථවත් කරගනිමු.

ගරු බර්නාඩ් බොක්ස් දේවගැති තුමා
ක්‍රිස්තියානි රෙපරමාදු දේවස්ථානය
රිජන්ට්වීදිය



# ඇත්තටම මිය ගියේ කායින්ද? ආබෙල්ද?



**කායින් තමාගේ සහෝදර වූ ආබෙල්ව මැරුවේය.**
**උත්පත්ති 4 : 8**

උත්පත්ති පොතේ 4 වන පරිච්ඡේදය යනු කිතුණු දැක්මට අනුව ලෝක වාර්තා රාශියකට හිමිකම් කියන පරිච්ඡේදයකි. එසේ හෙයින් ඒ වෙත අපගේ අවධානය යොමු කරමු.

මෙහි ආරම්භයේදීම පැවසු පරිදි මෙම පරිච්ඡේදයේ ඇති සුවිශේෂීය ලෝක වාර්තා නම්,
**ලොව මුල්ම පවුල**
**ලොව මුල්ම දරු උපත**
**ලොව මුල්ම සහෝදරයින්**
**මුල්ම පූජාව හා**
**ලොව මුල්ම මිනී මැරුම**
පිළිබඳව සඳහන්ව තිබීමය.

උත්පත්ති 3 : 16 ට අනුව ඒව නම් ලත් ලොව පළමු ස්ත්‍රිය විසින් දෙවියන්වහන්සේට අකීකරු වීම නිසා ඇයට උරුම වූ දඬුවම නම් **"උන්වහන්සේ ස්ත්‍රියට කථා කොට: නුඹේ ශෝකය හා ගැබ්ගැනීම බොහෝ සෙයින් වැඩි කරන්නෙමි. නුඹ වේදනා සහිතව දරුවන් වදන්නීය"** යන්න විය.

ඒ කෙසේ වුවද **දෙවියන්වහන්සේගේ පොරොන්දුව පරිදි ආදම් සහ ඒවට මෙන්ම මුළු මහත් මිනිස් සංහතියේම ලොවට දායාද කරමින් මෙලොව උපත ලැබූ ප්‍රථම දරුවා කායින් විය. මෙම දරු උපතත් සමඟ තම දෙමාපියන් වූ ආදම් සහ ඒව ඉමහත් ප්‍රීතියට පත් වූ බව දේව වචනය පවසයි. මන්ද ඒවාගේ වදන් ඊට මනාව සාක්ෂි දරයි.**

"මනුෂ්‍යයා තමාගේ භාර්‍යාවවූ ඒව හැඳින්නේය. ඈ ගර්භිණීව කායින් බිහි කර: ස්වාමීන්වහන්සේගෙන් මනුෂ්‍යයෙකු ලබා ගතිමි යි කීවාය."
(උත්පත්ති 4:1)

වරෙක දෙවියන්වහන්සේට අකීකරු වූ නිසා ඒදන් උයනෙන් පිටුවහල් කලා පමණක් නොව දරු ප්‍රසූතියේ දී ඇති වන වේදනාව මෙන්ම මරණය ද දඬුවමක් ලෙස ඇයට උරුම වුවත් ඇය දෙවියන්වහන්සේව විශ්වාස කල බව "ස්වාමින්වහන්සේගෙන් මනුෂ්‍යයෙකු ලබා ගතිමි" යන වදන් වලින් හැඟී යයි. කායින් යන නමෙහි අර්ථය නම් "අත්පත් කර ගැනීම, ලබාගැනීම හෙවත් සන්තක කර ගැනීම" වේ. මෙම නාමය තම පුතණුවන් හට තබන්නට ඇත්තේ ද ඇය තුළ වූ දේව භක්තිය නිසාම වන්නට පුළුවන.

**මන්ද යත්, දරු ගැබ පිළිසිඳ ගත් දවසේ සිට ඇගේ සිතුවිලි කෙබඳු වන්නට ඇද්ද? ජීවිතයේ පිළිසිඳ ගැනීමක හා දරු ප්‍රසූතියක පළමු අත්දැකීමකට මුහුණ දෙන්නට යන මැයට, දෙවියන්වහන්සේ පැවසූ වදන් හා දඬුවමේ වේදනාව මෙන්ම මරණය පිළිබඳවද බියක් සිත තුල පැන නැගුනා නම් එය පුදුම වෙන්නට හේතුවක් නොවේ.** මෙම සියලු අභියෝගයන් මැද තම පුතණුවන් බිහි කල ඇයට දෙවියන්වහන්සේ තමාගේද මැවුම්කාරයාණන් බවත්, මේ උපතද උන්වහන්සේගේම බවත් සිහිවන්නට ඇත. ඒ නිසාම වරක් පරාජිතව තිබුණු ඔවුන්ගේ ජීවිතවල අහිමිව තිබූ සතුට නැවත ලැබුණාක් මෙන් හැගෙන්නට ඇති බව නොඅනුමානය.

පසුව ආදම් සහ ඒවට තවත් පුත්‍රයෙකු ලැබිණ. ඔහු ආබෙල් නම් විය. කායින්ට මෙන් ආබෙල්ගේ උපත පිළිබඳ විශේෂ සඳහනක් මෙම පරිච්ඡේදය තුළ නැත. ඒ කෙසේ වුවද කායින් තම පියා අනුගමනය කරමින්, පියාගේ වෘත්තියම තෝරා ගනිමින් තම දෙමව්පියන්ට වඩාත් ඇළුම්ව ජීවත් වන්නට ඇත. නමුත් ආබෙල් තෝරා ගනු ලැබුවේ තම පියාගේ වෘත්තියට වඩා වෙනස්ම රැකියාවකි. එනම් ඔහු සත්ව පාලකයෙකි.

**එසේ වුවද මොවුන් දෙදෙනාම දෙවියන්වහන්සේට පූජාවක් ඔප්පු කළ යුතු යැයි ඉගෙන ගන්නට ඇත්තේ කාගෙන්ද?** නියත ලෙසම කායින් සහ ආබෙල් දිනෙන් දින වැඩෙත්ම ආදම් සහ ඒව වන තම මව්පියන් අනුගමනය කළ බවක් අපට මින් හැඟී යයි. මන්ද ඔවුන් දෙදෙනාම දෙවියන්වහන්සේට පූජා පඬුරක් ගෙන යාම තුළින් එය වඩාත් සනාථ වේ.

**ඇත්තටම දෙවියන්වහන්සේ කායින්ගේ පඬුර ප්‍රතික්ෂේප කලාද? ඒ ඇයි ? එසේ නොවුයේ නම් සහෝදරයෙක් අතින් තම සහෝදරයාගේ මරණය සිදු නොවෙන්නට තිබුණා යැයි අපට සිතෙන්නට පුළුවන.**

"කාලයකට පසු කායින් භූමියේ ඵලයෙන් ස්වාමින්වහන්සේට පඬුරක් ගෙනායේය"
(උත්පත්ති 4:3)

ඉහත පාඨයට අනුව කලකට පසුව කායින් දෙවියන්වහන්සේට පූජාවක් ඔප්පු කළ බව පෙනී යයි. කායින් විසින් දෙවියන්-වහන්සේ වෙත පූජාවක් ගෙන ගිය ද **ඔහු තුළ වූ ආකල්ප වල දුර්වලතාවයන් ඔහුගේම පෙර හා පසු හැසිරීම් රටාවන් වලින් මනාව පිළිඹිබු වේ.**

ජීවිතයේ දී වැරදි සිදුවිය හැකි අවස්ථා තිබිය හැක. නමුත් තම වරද තේරුම් ගෙන එය නිවැරදි කර ගැනීමට උත්සාහ දරනවා වෙනුවට තම සහෝදරයාට ඊර්ෂ්‍යා කිරීම, ඝාතනය කිරීම, බොරුකීම, දෙවියන්වහන්සේ හා සංවාදයේ යෙදෙන විට ඔහුගේ වචන වල වූ දැඩි බව ඔහු තුළ වූ ආකල්ප වල සැබෑ තත්වය හෙළිදරව් කරයි.

කායින්ගේ පඬුර දෙවියන්වහන්සේ ප්‍රතික්ෂේප කරනු ලැබුවේ ඔහුගේම යහපත උදෙසාය. තමන් කළ වරදට දඬුවම් කරනවා වෙනුවට, පසුතැවිලි වන්නටත්, එය නිවැරදි කර ගන්නටත් දෙවියන්වහන්සේ ඔහුට අවස්ථාවන් කිහිපයක්ම ලබා දුන් බව දේව වචනයෙන් පෙනී යයි. එම අවස්ථාවන් ප්‍රයෝජනයට ගෙන "ස්වාමීනී, වරද මා අතය. දුර්වල මා හට කමා වුව මැනව. මම රිසි පරිදි නැවත ඔබවහන්සේට පූජාවක් ගෙන එන්නෙමි" යි කියනවා වෙනුවට උරණ වූ ඔහුගේ වදන් වූයේ "මම මාගේ සහෝදරයාගේ රැකවලාද ?" යන්නයි. දෙවියන්වහන්සේගේ ප්‍රේමය දයානුකම්පාව කායින් කෙරේ විය. එහෙත් **තමන් තුළ වූ උඩඟුකම, කෝපය, ඊර්ෂ්‍යාව, තෘෂ්ණාව නිසාම කායින් පරාජිතයෙකු විය.**

මන්ද එදින සැබවින්ම මිය ගියේ කව්ද ? කායින් ය. මන්ද ආබෙල් හා දෙවියන්වහන්සේ අතර වූ යහපත් බැඳීම් දෙස බලන කළ ඔහු ශාරීරිකව මිය ගියද ආත්මිකව සදාකාලිකව ජයග්‍රහණයට ඇතුළු විය. පසුතැවිලිවීමට හෝ තම වරද නිවැරදි කර ගැනීමට අකමැති වූ කායින් පණ ඇති ඇවිදින මළ කඳකි.

**වර්තමානයේ නොදැනුවත්වම හෝ ඔබ මම තවත් කායින් කෙනෙකු හෝ ආබෙල් කෙනෙකු විය හැක. ඔබ මම කරන යාච්ඤාව, සේවාව, නමස්කාරය දෙවිඳුන් පිළිගත්තේ ද නැත් ද යන්න පිළිබඳව වුවද සමහරක් විට අප මෙතෙක් සැලකුවේ ද නැති වන්නට ඇති ඉඩකඩ බොහෝය. තවද උන්වහන්සේගේ ප්‍රේමය අපට කතා කරන සේක. අප උන්වහන්සේ ඉදිරියෙහි කරනු ලබන සෑම පූජාවක්ම පිළිගත හැකි වුවක්ද? නොවුවක්ද? මන්ද මවාපාන පුහු මාන්නය දෙවියන්වහන්සේට පිළිකුළකි.**

රොෂෙල් කුලසේන.
ක්‍රිස්තියානි රෙපරමාදු දේවස්ථානය,
බම්බලපිටිය.

# දිව්‍යමය ප්‍රේමය

කස පහර - ඇණ පහර - කටු ඔටුනු
කෙතරම් දුක් බරද ? ඒ මොහොත.....
නොසෙල් විය - ඔබේ සිත
ප්‍රේමයේ නාමයෙන්.....

හඬ ගැසුවෙහිද? පිය රජතුමන් හට
ඒලොයි ඒලොයි ලාමා සබක්තානී.....
තනිවම දුක - දරන්නට විය
ප්‍රේමයේ නාමයෙන්.....


කෙතරම් කටුකද? "පාපය" "ශාපය"
කෙතරම් දරුණුද අප ආ ඒ මග.....
ලොවම කම්පා - නැත සෙලවුනේ ඔබෙ සිත
ප්‍රේමයේ නාමයෙන්.....

අඳුරු විය ලොව - ගිගුරුම් හඬ සමග.....
පසුබට වුනේ නැත - ඔබෙ සිත
කිසිඳු මොහොතක වුවද
ප්‍රේමයේ නාමයෙන්.....

චණ්ඩ මාරුතය - වේගවත් විය
දෙකඩ විය - දෙව් මැඳුරේ තිර රෙදි.....
ඒත් යාගය - නැවතුනේ නැත
ප්‍රේමයේ නාමයෙන්.....


රැඳුණී ගල් සොහොන තුල - ඒ දේහය
ඉවත් විය - දේහයේ වෙළුම් පටි.....
විවර විය - ඒ මහා ගල් දොරටුව
ප්‍රේමයේ නාමයෙන්.....

අලුත් විය ලොව - මරණය පරාජය විය
එතුම් ආත්මය - නැගිටුණු සේක.....
මවිත විය මුළු ලොවම
ඒ දිව්‍යමය ප්‍රේමයේ නාමයෙන්.....



ජී. ඩබ්ලිව්. පී. කොස්තා
සුබ අස්න ශිෂ්‍ය
එම්මානුවෙල් දේවස්ථානය

# මාකඳුර - කඳානගෙදර යට ගිය අතීතය



යටත් විජිත සමයේ වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ පන්නල ප්‍රදේශයට නුදුරින් ඕලන්දයන් හා බ්‍රිතාන්‍යයන් මහා හමුදා කඳවුරක් පවත්වා ගෙන ගිය අතර, ඒ නිසාවෙන් ඒ අවට මහා කඳවුර ලෙස එකල හඳුන්වන්නට විය. පසු කලෙක එම මහා කඳවුර ප්‍රදේශය **"මාකඳුර"** ලෙස නම් පට බැඳෙන්නට විය.


20 වන ශත වර්ශයේ මැද භාගය වන විට මෙතෝදිස්ත සභාවක් මාකඳුර ප්‍රදේශයේ තිබුනද, ඊට තරමක් නුදුරින් වු එළිවිල ග්‍රාමයේ මහත් සේවයකට දොරටු විවෘත කරමින් මාකඳුර ප්‍රදේශයේ සිට නමස්කාරයට බම්බලපිටිය දේවස්ථා-නයට පැමිණි **දොස්තර ඇලන් මහතාගේ පවුල** රෙපරමාදු සභාවේ සේවයක් එහි දියත් කරනු පිණිස අප සභාවේ එවක දේවගැතිවරයකු ලෙස සේවය කල **ගරු ජෝන් වැන් එන්ස් දේවගැතිතුමාට** ආරාධනා කරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස මසකට වරක් ඇලන් මහතාගේ නිවසේ නමස්කාරයක් ආරම්භ කරන ලදි. එය තවදුරටත් වර්ධනය කරනු පිණිස **ගරු ජෝන් ෂුරින් දේවගැතිතුමා** සතියකට දෙවතාවක් සේවය සඳහා මාකඳුර බලා පිටත්ව ගොස් ඇති අතර, එම වෙහෙසීම් වල ප්‍රතිඵලයක් ලෙස **1955 වර්ෂයේ දෙසැම්බර් මස 11 වන දින 44 දෙනෙකු සභා සාමාජිකත්වය ලැබීය.** එම සේවයේ වර්ධනය නිසාවෙන් ඇලන් මහතා සිය පුද්ගලික ඉඩමක් සේවය සඳහා පරිත්‍යාග කරන ලදි. **පළමුවෙන් එහි කොට බිත්ති සහිත සරළ දේවස්ථානයක් ඉදිකල අතර 1957 දී එය ලියාපදිංචි කිරීමෙන් අනතුරුව 1957 මාර්තු මස 1 වන දින සිට ගරු සැමුවෙල් මෙන්ඩිස් එවැන්ජලිස්ත තුමා පූර්ණ කාලීනව සේවය භාර ගත්තේය.** එහි පළමු සංවත්සරය දින ඇදහිලිවතුන් 104 දෙනෙකු ඇදහිල්ල ප්‍රකාශ කරමින් අප සභාව හා එක් විය. එම සේවය වඩ වඩාත් වර්ධනය වීමත් සමඟම 1961 **මාර්තු 4 වන දින වැඩිමහල්ලෙකු හා උපස්ථායකවරයෙකු සමඟින් මාකඳුර කොන්සිස්ටරිය බිහි විය.** 1963 **ජුලි 06 වන දින ගරු ආනන්ද පෙරේරා සහ ගරු ජෝන් වැන් හෙන්ස් යන දේවගැතිවරුන් විසින් එම භූමිය කැප කරන ලද අතර 1963 ජුලි 23 වන දින මිශන් නිවස ඉදි කිරීමට පළමු පස් පිඩැල්ල සභාවේ පැරණිම සාමාජිකයෙකු වු පෝල් ප්‍රනාන්දු මහතා අතින් සිදු විය.** ඉන් අනතුරුව වර්තමාන දේවස්ථානය ගොඩනැගිල්ල **1967 ජුනි මස 07** වන දින ඉදිකර කැප කරන ලදි. පසුව එම සේවය අඛණ්ඩව වර්ධනය වෙමින් කඳානගෙදර ප්‍රදේශයේ බේකරි කර්මාන්තයේ නියුතුව සිටි **පීටර් සිංඤෝ මහතාගේ** බේකරියේ කොටසක දේව මෙහෙයක්, එවක මාකඳුර සභාවෙන්ම යේසුස්වහන්සේව හඳුනාගෙන සේවයට කැපවූ එවැන්ජලිස්ත වරයකු ලෙස සේවය කල **එවැන්ජලිස්ත වීරසිංහ** ආරම්භ කළේය. එහිදී ඇතිවූ මතභේද නිසාවෙන්ම පසුව පුවත්පත් ව්‍යා-පාරිකයකු වූ ජයසිංහ මහතාගෙන් රු 6000/-ක වටිනාකමකට කඳානගෙදර භූමිය මිලදී ගෙන **1980 මැයි මස 22 වන දින එහිද කුඩා දේවස්ථානයක් ඉදිකොට කැප කරන ලදි.**

නමුත් පසුගිය දින වල ඇද හැලුණු අධික වර්ෂාව නිසාවෙන් වසර 41ක් සම්පූර්ණවී දින කිහිපයක් ගතවත්ම 2021 ජුනි මස 04 දින එම ගොඩනැගිල්ලෙහි කොටසක් කඩා වැටිණ. **1979 වර්ෂයේ විශ්‍රාම ලත් එවැන්ජලිස්ත ගරු ඩේවිඩ් කුලසේ-න සභාපාලකතුමා** මාකඳුර සභාව තුළ මහත් මෙහෙවරක් කරමින් එවක කඳානගෙදර සේවය කළ **ගරු එවැන්ජලිස්ත වීරසිංහ** කඳානගෙදර හා මාකඳුර යන සේවා ස්ථාන දෙකම භාර කරන ලදි. මාකඳුර සභාව තුළ ඇදහිලිවතුන් තම පවුල් වෙත ශුභාරංචිය ගෙනයාමේ ක්‍රමයක් තුළින් එකල සේවය කළ එවැන්ජලිස්තවරුන් එම ඇදහිලිවතුන්ගේ ඥාතීන් සමඟ ඇති කරගත් **සුහදත්වය නිසාවෙන් ළිහිරියාගම හා බොඩිමුල්ල ප්‍රදේශයන් වෙතද සේවයන් ව්‍යාප්ත විය.** බොඩිමුල්ල සේවය අප සභාවේ දේවස්ථාන භාරකරුවකු ලෙස සේවය කල මාගේ පියා වන **සරත් වික්‍රමසිංහ මහතාගේ නිවසේ** පැවති අතර එවක නමස්කාරය සඳහා බොඩිමුල්ලේ ඇදහිලිවතුන් 25 දෙනෙකු පමණ ඊට සහභාගි විය. පසුව එම සේවයන් සඳහා **ගරු ජේම්ස් කුලසේන, ගරු රෙජී රත්නායක, ගරු සුනිල් ගුණසේකර, ගරු එස්. පුෂ්පරාජා, නැවත ගරු පී. විරසිංහ හා ගරු පුෂ්පකුමාර රත්නායක** යන සභාපාලකවරුන් දායකත්වය ලබා දුනී. වර්ථමානයේ කවර කලකටත් වඩා අභියෝගාත්මක සේවයක් කිරිම පිණිසත් බොහෝ දේ නැවත ගොඩ නගන පිණිසත් **ගරු නාමල් නුවන් සභාපාලකතුමන්** දෙවියන්වහන්සේ විසින් එහි කැඳවා ඇත.

**මාකඳුර සේවය තුළින් බිහිවූ බොහෝමයක් සේවා අද වන විට නොමැති වුවත්, එම සේවා හරහා ඉටු වු ශුභාරංචියේ බලපෑම පරම්පරා ගණනාවක් වෙත එහි බලපෑම් එල්ල කර ඇත.** ඉදිරියටත් එම සේවය වඩා ශක්තිමත්ව ඉටු කිරීම පිණිස මෙම ලිපිය කියවන ඔබ එම සභාව උදෙසාත් එහි සේවය කරන නාමල් නුවන් සභාපාලකතුමන් හා ඔහුගේ පවුල උදෙසාත්, එම සේවා භාරව කටයුතු කරන රීජන්ට් වීදිය කොන්සිස්ටරිය උදෙසාත් යාච්ඤා කරන මෙන් ඉල්ලමි.


ගරු ඇන්ඩෲ වික්‍රමසිංහ සභාපාලකතුමා
ක්‍රිස්තියානි රෙපරමාදු දේවස්ථානය
මාතර

# සභා පුවත්



දෙහිවල දේවස්ථානයේ ඇදහිලිවන්ත කණ්ඩායමක් විසින් මාකදුර දේවස්ථානයේ තීන්ත ආලේප කිරීම






බම්බලපිටිය දේවස්ථානයේදී පැවැත්වූ නිදහස් දින දේව මෙහෙය



මාකදුර දේවස්ථානයේදී පැවැත්වූ නිදහස් දින දේව මෙහෙය






2021 04 04 පාස්කු ඉරුදින කොහුවල දේවස්ථානයේදී බව්තිස්ම වූ ශකිලා අසංගිකා සහෝදරිය සහ ඇදහිල්ල ප්‍රකාශ කර සභා සාමාජිකත්වය ලැබූ රෝපින් හා රෝනෙත් ගුණරත්න සහෝදරයින්




බම්බලපිටිය දේවස්ථානයේදී පැවැත්වූ ක්‍රිස්තියානි රෙපරමාදු කාන්තා සංගමයේ මහ සභා රැස්වීම සහ 2021 වසර සඳහා පත්වූ නව නිළධාරී මඩුල්ල

මාතර දේවස්ථානයේ බව්තිස්මය හා ඇදහිල්ල ප්‍රකාශ කරනු ලැබූ යොහන් තිමෝති, නවෝද් දිල්හාර, නිපුනි ලියාරා, ෂෙහාරා සෙනුරි, අමායා දෙව් තිළිණි, නිම්ෂා ශාමින්දි, තරුෂි දිමන්ති හා දිලාන් චතුරංගඅය ආලේප කිරීම











දෙහිවල දේවස්ථානයේදී මහ සිකුරාදා දේව මෙහෙයේදී බව්තිස්මය ලැබූ වීෂා ෂෙනලි කුමාරතුංග, යලිත්මා අක්ෂනා, යලිත්මා අරුන්දි, හිරුකි බිහංසා හා දිනුෂිකා පෙරේරා





ආදුරුප්පුවීදිය දේවස්ථානයේ බව්තීසමය ලැබූ ෂයනි මලිසා ද සිල්වා, ෂේන් ඩේමියන් ද සිල්වා, ඇදහිල්ල ප්‍රකාශ කළ තිමති අභිෂේක් ඇල්පිටිය, යොවාන් සිවකුමාර්, මොරීන් දිර්ශාල් සිවකුමාර් සහ සභා සාමාජිකත්වය ලැබූ අනුරාධා මධූෂානි ප්‍රනාන්දු, තයාගරාජා සුලෝචනා



මාතර දේවස්ථානයේ උපස්ථායකවරුන් ලෙස නාදිනී අලුත්ගේ හා ධම්මික සිසිර යන අය ආලේප කිරීම



කල්පිටිය දේවස්ථානයේ බව්තීස්මය හා සභා සාමාජිකත්වය ලැබූවන්

කොළඹ 06, ගාලු පාරේ, නො.363 හි පිහිටි ක්‍රිස්තියානි රෙපරමාදු සභාව වෙනුවෙන් චමින්ද රත්නායක සභාපලක තුමා විසින් සංස්කරණය කර, නො.119, ගංගොඩවිල, නුගේගොඩ, ඉම්ප්‍රෙෂන්ස් මුද්‍රණාලයේ මුද්‍රණය කර ක්‍රිස්තියානි රෙපරමාදු සභාව මගින් කොළඹදී ප්‍රසිද්ධ කරන ලදී.